# සටහන

2024 ජූලි - සැප්තැම්බර් 43 වෙළුම 7- 9 කලාපය




2 මෙක්සිකෝවේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 රාජ්‍ය මූල්‍ය සහ ණය කළමනාකරණයේ දී රජයකට මුදල් ස්වාරක්ෂකයක් (Cash Buffer) පවත්වාගෙන යාමේ වැදගත්කම

7 ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය

12 ඓතිහාසික ලෝක වෙළෙඳ ප්‍රවණතා හා ශ්‍රී ලංකාවේ වෙළෙඳාම

27 මූල්‍ය අර්බුදය තුළ රාජ්‍ය මුදල් කළමනාකරණයේ කාර්යභාරය


රු. 80/-

ISSN 1391-3697

9 771391 369007 02479

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව




# මෙක්සිකෝව

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



නිල වශයෙන් එක්සත් මෙක්සිකානු ජනපදය මෙක්සිකෝව ලෙස හැඳින්වේ. උතුරු ඇමරිකාවේ දකුණු කොටසෙහි පිහිටි රටකි. වර්ග කිලෝමීටර 1,972,550ක (වර්ග සැතපුම් 761,610) භූමි ප්‍රමාණයකින් යුත්, මෙය වර්ගඵලය අනුව ලොව 13 වන විශාලතම රට වේ. මිලියන 130 කට ආසන්න ජනගහනයක් සහිත එය ලොව වැඩිම ජනගහනය සහිත රටවල් අතර 10 වන තැප ගනී. ලොව ස්පාඤ්ඤ භාෂකයන් වැඩි ම ප්‍රමාණයක් සිටින රට ද මෙක්සිකෝව වේ. මෙක්සිකෝව යනු ප්‍රාන්ත 31 කින් සමන්විත ව්‍යවස්ථාපිත ජනරජයක් වන අතර එහි අගනුවර සහ විශාලතම නගරය වන මෙක්සිකෝ නගරය ලෝකයේ වඩාත් ම ජනාකීර්ණ අගනගරයකි.

උතුරින් ඇමෙරිකා එක්සත් ජනපදය, ගිනිකොන දෙසින් ග්වාතමාලාව සහ බෙලීස් මෙක්සිකෝ රාජ්‍යයේ ගොඩබිම් මායිම් වේ. බටහිරින් පැසිෆික් සාගරය, ගිනිකොන දෙසින් කැරිබියන් මුහුද සහ නැගෙනහිරින් මෙක්සිකෝ බොක්ක සමුද්‍ර මායිම් වේ.

පූර්ව-කොලොම්බියානු මෙක්සිකෝවේ මානව පැවැත්ම ලොව ශිෂ්ටාචාරයේ උත්පත්තිස්ථාන හයෙන් එකක් ලෙස ක්‍රි.පූ. 8,000 දක්වා දිව යයි. එය මෙසෝ ඇමරිකානු කලාපය ඔල්මෙක්, මායා, සැපොටෙක්, තියෝතිහුවාකාන් සහ පුරෙපෙචා ඇතුළු ශිෂ්ටාචාරවලට සම්බන්ධය. ඇස්ටෙක්වරු මෙම ප්‍රදේශයේ ආධිපත්‍යය දැරූ නමුත් ස්පාඤ්ඤ අධිරාජ්‍යය විසින් යටත් කර ගන්නා ලද අතර එම අධිරාජ්‍යය විසින් මින් පෙර අගනුවර වූ ටෙනොච්ටිට්ලාන් (දැන් මෙක්සිකෝ නගරය) කේන්ද්‍ර කර ගනිමින් නව ස්පාඤ්ඤයේ යටත් විජිතයක් පිහිටුවන ලදී. ඊළඟ ශතවර්ෂ තුන තුළ ස්පාඤ්ඤය සිය භෞමික පාලනය පුළුල් කර, ක්‍රිස්තියානි ධර්මය බලාත්මක කර, යටත් විජිතයේ පොහොසත් රිදී නිධි සිය අධිරාජ්‍යයේ පෝෂණය සඳහා යොදාගනිමින් ස්පාඤ්ඤ භාෂාව ව්‍යාප්ත කළේ ය.

මූලාශ්‍ර -
https://en.wikipedia.org/wiki/Mexico

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>1,964,375<br>1,943,945<br>20,430 |
| ජනගහනය (2021 ඇස්තමේන්තු) | 130,739,927 |
| ජනගහන වර්ධන වේගය (2024 ඇස්තමේන්තු) | 0.72% |
| උපත් අනුපාතය (2024 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 14.3 |
| මරණ අනුපාතය (2024 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 6.5 |
| ළදරු මරණ අනුපාතය (2024 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 12.1 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2024 ඇස්තමේන්තු) | 74.6 |
| දළ දේශීය නිෂ්පාදිතය (2022 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 1,466 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2023 ඇස්තමේන්තු) | 3.23% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2022 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 11,496.52 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>3.6%<br>31.9%<br>64.5% |
| ශ්‍රම බලකාය (2023 ඇස්තමේන්තු) | මිලියන 60.042 |
| සේවා වියුක්තිය (2019 ඇස්තමේන්තු) | 2.81% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2022 ඇස්තමේන්තු) | 43.5 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | -1.1% |
| උද්ධමන අනුපාතය (2019 ඇස්තමේන්තු) | 5.53% |
| ආනයන (2023 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 673.828 |
| ආනයන භාණ්ඩ | පිරිපහදු කළ ඛනිජ තෙල්, වාහන අමතර කොටස්/ උපාංග, යන්ත්‍ර කොටස්, ඒකාබද්ධ පරිපථ, |
| අපනයන (2023 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 649.312 |
| අපනයන භාණ්ඩ | කාර්, පරිගණක, වාහන අමතර කොටස්/ උපාංග, බොරතෙල්, ලොරි රථ |
| මුදල් ඒකකය | මෙක්සිකානු පෙසෝ |


“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# රාජ්‍ය මූල්‍ය සහ ණය කළමනාකරණයේ දී රජයකට මුදල් ස්වාරක්ෂකයක් (Cash Buffer) පවත්වාගෙන යෑමේ වැදගත්කම

**කේ එම් එස් සී කුලතුංග**
**නියෝජ්‍ය අධිකාරී**
**රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව**

**හැඳින්වීම**

රාජ්‍ය මූල්‍ය හා ණය කළමනාකරණයේ දී රජයකට තම මූල්‍ය මෙහෙයුම් කටයුතු සාර්ථක ව සහ අවදානමකින් තොර ව කරගෙන යෑම සඳහා මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑම වැදගත් වේ. විශේෂයෙන් ම වැටුප්, විශ්‍රාම වැටුප් හා අනෙකුත් අත්‍යවශ්‍ය සුභසාධන කටයුතු වැනි අනිවාර්ය රජයේ ගෙවීම් සහ ණය සේවාකරණ ගෙවීම් පැහැර හැරීමේ අවදානමකින් තොර ව අඛණ්ඩ ව සිදු කරමින් මූල්‍ය මෙහෙයුම් සුමට ව පවත්වා ගැනීම සඳහා රටකට මුදල් ස්වාරක්ෂකයක් අවශ්‍ය වේ. ඒ අනුව, මෙම ලිපියෙන් මුදල් ස්වාරක්ෂකයක් යනු කුමක්ද? මුදල් ස්වාරක්ෂකයක් රටකට අවශ්‍ය වන්නේ මන්ද? මුදල් ස්වාරක්ෂක ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද? එහි ආයෝජන අවස්ථා මොනවාද? සහ අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධ පසුබිම සාකච්ඡා කිරීම ට අපේක්ෂා කෙරෙයි.

**මුදල් ස්වාරක්ෂකයක් යනු කුමක්ද?**

මුදල් ස්වාරක්ෂකයක් යනු රටක මූල්‍ය ප්‍රවාහ පුරෝකථනයන්හි යම්කිසි විචලනයක් සිදු වූ අවස්ථාවක ප්‍රයෝජනයට ගැනීම සඳහා රජය විසින් මූල්‍ය පහසුකමක් ලෙස (Cash Cushion) පවත්වාගෙන යනු ලබන අරමුදලකි. මෙසේ මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑම අනපේක්ෂිත මූල්‍ය කම්පනයන්ට මුහුණ දීමට අපහසු මෙන් ම සීමාසහිත වෙළඳපොළ ප්‍රවේශයක් ඇති රටවලට ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම ලෝකයේ බොහෝ රටවල් 2008-2009 මූල්‍ය අර්බුදයෙන් හා COVID-19 වසංගතයෙන් පසු හදිසි මූල්‍ය කම්පනයන්ට මුහුණ දීම සඳහා මෙලෙස මුදල් අතිරික්තයක් පවත්වාගෙන යයි. ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට (The Organization for Economic Cooperation and Development) අයත් රටවල් 35න් රටවල් 29ක් තම රටවල මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යයි (Crux & Koc, 2018).

**රටක් මුදල් ස්වාරාක්ෂකයක් පවත්වාගෙන යා යුත්තේ ඇයි?**

රජය විසින් මූල්‍ය හා ණය කළමනාකරණයේ දී අවදානම් කළමනාකරණ උපකරණයක් ලෙස මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑම වැදගත් වේ. රාජ්‍ය අයවැය ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂිත ආදායම් පුරෝකථනය කළ කාල සීමාව තුළ නොලැබී යෑම, ණය ලැබීම් හා ණය සේවාකරණය අතර නොගැලපීම් ඇතිවීම, රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි අසාර්ථක වීම, අනපේක්ෂිත ලෙස රජයේ වියදම් ඉහළ යෑම ආදී අවස්ථාවල දී රජයකට මුදල් ස්වාරක්ෂකයක් තමා සන්තක ව තිබීම වැදගත් වේ.

විශේෂයෙන්ම COVID-19 වසංගත කාල සීමාව තුළ ලෝකයේ බොහෝමයක් රටවලට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අභියෝග රැසකට මුහුණ පෑමට සිදු විය. එනම්, COVID-19 වසංගත කාලයේ දී ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන් රටවල ආදායම් ලැබීම් අඩු වූ අතර, අනෙක් අතට අනපේක්ෂිත ලෙස රාජ්‍ය වියදම් ඉහළ ගියේ ය. විශේෂයෙන් ම, සෞඛ්‍ය සේවාවන් සඳහා අනපේක්ෂිත ලෙස වැඩි වශයෙන් මුදල් වියදම් කිරීමට සිදු විය. මේ අනුව, රජයේ මුදල් ප්‍රවාහයේ විචලනයන් වැඩි වීම තුළ අනපේක්ෂිත ලෙස රජයේ ණය ගැනීම් ඉහළ යෑම,

දැඩි වෙළඳපොළ අස්ථාවරභාවයක් ඇති වීම, සෞඛ්‍ය අවදානම (Health Risk) හේතුවෙන් සේවා ස්ථානවල මෙහෙයුම් අවදානම වැඩි වීම වැනි අභියෝග රැසකට COVID-19 වසංගත සමයේ දී රටවලට මුහුණ දීමට සිදු විය.

මෙවැනි අවස්ථාවල දී මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යන රජයයන් හට මෙවැනි මූල්‍ය අර්බුදකාරී තත්ත්වයන්ගෙන් මිදීම සඳහා තම ස්වාරක්ෂකය යොදා ගත හැකි ය. එසේ නොවුනහොත් රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩි පිරිවැයක් යටතේ ණය ගැනීමට රජයට සිදු වනු ඇත. මේ අනුව, COVID-19 වසංගතයෙන් පසු ඩෙන්මාර්කය, ස්වීඩනය, ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් ද තමන් පවත්වාගෙන යන මුදල් ස්වාරක්ෂක මට්ටම් ඉහළ දමන ලදී.

### මුදල් ස්වාරක්ෂක ඉලක්කයක් නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද?

මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑමේ දී රටකට යම්කිසි පිරිවැයක් දැරීමට සිදු වේ. එම නිසා මුදල් ස්වාරක්ෂකය කුමන මට්ටමකින් පවත්වාගෙන යා යුතුද යන්න රජයේ ණය කළමනාකරණ ආයතනය[1] විසින් තීරණය කළ යුතු වේ.

ජාත්‍යන්තර වශයෙන් ගත් විට රටවල් තමන් කොපමණ ප්‍රමාණයකින් මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යනවාද (Cash buffer targets) යන්න තීරණය කිරීමේ දී පොදු ක්‍රමවේදයක් දක්නට නොලැබෙන අතර විවිධ ක්‍රමවේද භාවිතා කරනු ලබන බව වගුව 1 මගින් පෙනේ.

මුදල් ස්වාරක්ෂක ඉලක්කයක් තීරණය කිරීමේ දී ණය කළමනාකරණ ආයතනයට පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විම කළ යුතු වේ.

- රාජ්‍ය අයවැයෙහි පුරෝකථන දෝෂ නිසා ඇති වන අස්ථාවරත්වය
- අනපේක්ෂිත රාජ්‍ය වියදම්
- රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි මගින් අපේක්ෂිත ආකාරයට ණය ලබා ගැනීමට නොහැකි වන අවස්ථා

**වගුව 1 - තෝරා ගත් රටවල් කිහිපයක මුදල් ස්වාරක්ෂක ඉලක්කයන් (Cash Buffer Targets)**

| රට | මුදල් ස්වාරක්ෂක ඉලක්කය |
|---|---|
| කැනඩාව (2020) | කූපන් ගෙවීම් හා ණය ප්‍රතිමූල්‍යකරණ අවශ්‍යතා ඇතුළු ව මාසයක් සඳහා පුරෝකථනය කළ දළ මූල්‍ය ප්‍රවාහයන් (One month net projected cashflows including coupon payments & debt refinancing needs) |
| ඩෙන්මාර්කය (2020) | රාජ්‍ය සුරැකුම්පත්වල වාර්ෂික ප්‍රතිමූල්‍යකරණ අවශ්‍යතාව (Annual Refinancing Requirement) |
| ග්‍රීසිය (2019) | ඉදිරි වසර හතරේ ණය සේවාකරණය (භාණ්ඩාගාර බිල්පත් හැර) |
| හංගේරියාව (2020) | සති 6ක රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාව |
| පෘතුගාලය (2018) | ඉදිරි මාස 12ක රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාවෙන් සියයට 40 |
| රුමේනියාව (2018) | විදේශීය මුදලින් මාස හතරක දළ ණය අවශ්‍යතාව |
| තුර්කිය (2014) | වාර්ෂික ණය සේවාවේ හෙළි නොකළ ප්‍රතිශතයක් (An undisclosed % of Annual Debt Service) |
| උරුගුවේ (2014) | වාර්ෂික ණය සේවාවට වඩා වැඩි ප්‍රමාණයක් (More than the Annual Debt Service) |
| ඇ.එ.ජ. (2015) | සතියක රාජ්‍ය මූල්‍ය පිටතට ගලා යෑම් |

මූලය: Hurcan, Koc & Balibec (2020)

1. රාජ්‍ය ණය කළමනාකරණයේ දී ඒ හා සම්බන්ධ ආයතනික සැලැස්ම රටකින් රටකට වෙනස් වේ. ජාත්‍යන්තර වශයෙන් ගත් විට රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය බොහෝ විට මහ බැංකුවේ, මුදල් අමාත්‍යංශයේ හෝ වෙන ම ස්වාධීන ආයතනයක් ලෙස පිහිටා තිබෙනු දක්නට ලැබේ.

- රජයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් අතර කාල පරතරය (Time differences between Cash inflows & outflows)

රාජ්‍යයන් විසින් තම මුදල් ස්වාරක්ෂකයන් විවිධ ක්‍රම මගින් ගොඩ නගනු ලබයි. Crux & Koc (2018), විසින් කරන ලද සමීක්ෂණයකට අනුව සියයට 80 පමණ රටවල් වැඩිපුර ණය ගැනීම් (Over Borrowing) මගින් මුදල් ස්වාරක්ෂකයන් ගොඩ නගන අතර තවත් රටවල් අයවැය අතිරික්තයන්, විශේෂ ගැණුම් හිමිකම් (Special Drawing Rights) හා විදේශ සංචිත වැනි ක්‍රම මගින් මුදල් ස්වාරක්ෂකයන් නිර්මාණය කරනු ලබන බව අනාවරණය විය.

### මුදල් ස්වාරක්ෂක ආයෝජන ප්‍රතිපත්තීන් මොනවාද?

මුදල් ස්වාරක්ෂකය ආයෝජනය කළහොත් ලබා ගත හැකි ප්‍රතිලාභය සහ මුදල් ස්වාරක්ෂකය ගොඩ නැගීම සඳහා වැය කරන ලද පිරිවැය අතර වෙනස "රැගෙන යාමේ පිරිවැය" (Cost of Carry) ලෙස හඳුන්වයි. මෙය සාමාන්‍යයෙන් ධන අගයක් ගනු ලබයි.

මුදල් ස්වාරක්ෂකයක් පවත්වාගෙන යෑම රටකට පිරිවැයක් බැවින් එම පිරිවැය අවම කිරීම සඳහා මුදල් ස්වාරක්ෂකයක් සැලසුමකට අනුව මනාව ආයෝජනය කළ යුතු ය. මෙහි දී රජය විසින් මුදල් ස්වාරක්ෂකයක ආයෝජනය කරනු ලබන උපකරණ, කාල සීමාව සහ කුමන උපකරණයන්හි ආයෝජනය කරන්නේද යන්න පිළිබඳ ව තීරණ ගත යුතු ය. මේ අනුව, මුදල් ස්වාරක්ෂකයක් ඇති බොහෝ රටවල්වලට එය අයෝජන කිරීමේ ප්‍රතිපත්තියක් ද (Investment Policy) ඇත. තෝරා ගත් රටවල් කිහිපයක ආයෝජන ප්‍රතිපත්ති වගුව 2 මගින් දක්වා ඇත.

Cruz & Koc (2018), විසින් ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට අයත් රටවල් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයේ දී එම රටවල් වලින් සියයට 77ක ආයෝජන සැලසුමක් පවත්වාගෙන යන අතර බහුතරයක් රටවල් අවදානම් අඩු බැවින් තම ස්වාරක්ෂකයන් මහ බැංකුවෙහි (සියයට 74) ආයෝජනය කරනු ලබන බව හෙළි වී ඇත.

**වගුව 2 - තෝරාගත් රටවල් කිහිපයක මුදල් ස්වාරක්ෂක ආයෝජන ප්‍රතිපත්තීන්**

| රට | ආයෝජනය කරන ලද උපකරණය |
|---|---|
| ඕස්ට්‍රේලියාව | මහ බැංකුවෙහි තැන්පතු සහ ඉහළ ශ්‍රේණිගත කිරීම් සහිත බලයලත් ආයතන මගින් නිකුත් කරන ලද තැන්පතු සහතිකපත්වල |
| කැනඩාව | මූල්‍ය ආයතන වල තැන්පතුවල |
| චීනය | රජයේ බැංකුවල දින 90 තැන්පතුවල |
| ප්‍රංශය | මහ බැංකුවෙහි තැන්පතු, එක් දින වෙළෙඳපොළ තුළ (Overnight Market) හා ප්‍රති විකුණුම් (Reverse Repo) ලෙස |
| හංගේරියාව | ප්‍රති විකුණුම් ලෙස ප්‍රාථමික අලෙවිකරුවන් සහ දේශීය බැංකුවල |
| රුසියාව | බැංකු තැන්පතු හා ප්‍රති විකුණුම්වල |
| ස්පාඤ්ඤය | කාලීන තැන්පතුවල |
| නෙදර්ලන්තය | මහ බැංකුවෙහි තැන්පතු සහ ප්‍රති විකුණුම් ලෙස |
| එක්සත් රාජධානිය | ප්‍රතිවිකුණුම් (දින 30) ලෙස |
| කොලොම්බියා | මහ බැංකුවෙහි තැන්පතු සහ භාණ්ඩාගාර බැඳුම්කරවල |
| ඇ.එ.ජ. | ඇපකර සහිත තැන්පතුවල (Collateralized Deposits) |
| වියට්නාමය | වාණිජ බැංකුවල කාලීන තැන්පතු ලෙස |
| පේරු | මහ බැංකුවෙහි තැන්පතු සහ වාණිජ බැංකු තැන්පතුවල |

මූලය: Fainboim, Saxena & Williams (2020)

## මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගැනීමේ ප්‍රතිපත්තිය - ශ්‍රී ලංකාවේ පැතිකඩ

2023 සැප්තැම්බර් මස 15 දින, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන ලබා දීමේ ප්‍රතිපත්තිය (Monetary Financing) වෙනස් විය. මහ බැංකුව විසින් නව පනත බලාත්මක කිරීමෙන් පසු ඉදිරි මාස දහ අටක් සඳහා පමණක් රජය වෙත මූල්‍යන ලබා දීමේ තාවකාලික වැඩ පිළිවෙලක් පවතී. ඒ අනුව, රජයේ අනපේක්ෂිත රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සඳහා මහ බැංකුව විසින් සපයනු ලැබූ මුදල් මූල්‍යකරණය ඉදිරියේ දී සම්පූර්ණයෙන් ම අහෝසි වනු ඇත. උදාහරණයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසියක් අසාර්ථක වුවහොත් නව පනත පැමිණීමට පෙර එවැනි අවස්ථාවක දී පරිණත වන සුරැකුම්පත් පියවීම සඳහා මහ බැංකුවේ මූල්‍යකරණ පහසුකම වෙත යොමු වීමට රජය පෙළඹිණි. එසේ රජයට මූල්‍යකරණය පහසුකමක් නොමැති අවස්ථාවක දි වර්තමාන සන්දර්භයට අනුව රාජ්‍ය සුරැකුම්පත් සඳහා අවශ්‍ය අරමුදල් ඕනෑම පිරිවැයක් යටතේ රැස් කිරීමට රජයට සිදු වී ඇත. මුදල් අතිරික්තයක් නොමැති විට, රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි අසාර්ථක වීම් වැනි වෙළඳපොළ අවිනිශ්චිතතා සැලකිල්ලට ගෙන එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා රජය විසින් මුදල් අතිරික්තයක් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව මතු විය.

නව මූල්‍ය පරිසරය සැලකිල්ලට ගනිමින් රාජ්‍ය මූල්‍ය ප්‍රවාහය සුමට කිරීමේ අරමුණින් අනපේක්ෂිත රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා රජයේ ආදායමෙන් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසිවලින් රැස් කරන ලද අතිරේක මුදලින් මුදල් ස්වාරක්ෂකයක් ගොඩ නැගීම සඳහා 2023 වසර අවසාන භාගයේ සිට මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය ක්‍රියාකාරී ව කටයුතු කරන ලදී. මේ අනුව, මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආදායමෙන් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි මගින් රැස් කරන ලද අතිරේක මුදලින් මුදල් ස්වාරක්ෂක අරමුදලක් ගොඩ නැගීම ආරම්භ කරන ලදී. විශේෂයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසිවල දී සුදුසු අවස්ථා පිළිබඳ ව අවධානය යොමුකර (Opportune Time) අතිරේක මුදල් ප්‍රමාණයක් රැස් කර ස්වාරක්ෂක අරමුදලට බැර කරන ලදී. එසේ ම, අනෙක් අතට ස්වාරක්ෂක අරමුදලක් පවතින විට හඳුනාගත් අවස්ථාවන්හි දී රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි වල දී පිරිනමන ප්‍රමාණය අඩු කිරීම මගින් එළඳා අනුපාතික අඩු කිරීමට ද හැකියාව ලැබුණි. ස්වාරක්ෂක අරමුදල මුදල් අමාත්‍යාංශයට ණය සේවාකරණ වගකීම් සාර්ථක ව සපුරාලීමට ඉවහල් වූ අතර රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමට ද වක්‍ර ව දායකත්වය ලබා දුනි. ඒ අනුව, 2023 වසර අවසානය වන විට රුපියල් බිලියන 79ක මුදල් ස්වාරක්ෂකයක් රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි මගින් ගොඩ නගා තිබුණි. 2024 වසරේ මුල් මාස කිහිපය තුළ රාජ්‍ය සුරැකුම්පත් වල පොලී අනුපාතිකවල සැලකිය යුතු පහළ යෑම සඳහා රජයේ මුදල් ස්වාරක්ෂක පහසුකම ද ඍජු ව ම බලපාන ලදි. මේ අනුව, මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම මගින් අනවශ්‍ය පොලී අනුපාතික විචලනයන්ට විධිමත්ව මුහුණ දීමට හැකි වන අතර ඒ සඳහා අවශ්‍ය අවස්ථාවල දී මහ බැංකුව මුදල් අමාත්‍යාංශය සමග ක්‍රියාකාරී ව කටයුතු කරනු ඇත.

මේ අනුව, 2023 වසරේ ණය කළමනාකරණ මුල්පිරීම් අතර මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය එකතුව ප්‍රමාණවත් මුදල් ස්වාරක්ෂකයක් ප්‍රථමවරට ගොඩ නැගීම හා පවත්වා ගැනීමට කටයුතු කිරීම සුවිශේෂී කඩඉමක් ලෙස හැඳින්විය හැකි ය. කෙසේ වුව ද, මුදල් ස්වාරක්ෂක අරමුදලක් පවත්වාගෙන යෑමේ දී රජයට පිරිවැයක් දැරීමට සිදු වේ. රජය සතු අතිරික්ත අරමුදල් ස්වාරක්ෂක අරමුදල් ගොඩනැගීම සඳහා නොයොදා අනෙකුත් රාජ්‍ය සේවාවන් හා ප්‍රාග්ධන වියදම් සඳහා යොදා ගතහැකි බවට සලකන්නේ නම්, ස්වාරක්ෂක අරමුදල පවත්වාගෙන යෑම රජයට ආවස්ථික පිරිවැයකි. විශේෂයෙන් ම, රාජ්‍ය සුරැකුම්පත්හි නිකුතු මගින් එකතු කරන ලද අතිරික්ත මුදල්වලින් ස්වාරක්ෂකය වෙත කරනු ලබන දායකත්වය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදු වේ. මේ අනුව, එවැනි ස්වාරක්ෂකයක් නඩත්තු කිරීම රජයට පිරිවැයක් වන බැවින්, මුදල් ස්වාරක්ෂකය පවත්වාගෙන යෑමේ පිරිවැය අවම කර ගැනීම සඳහා සුදුසු මට්ටමක උපරිමයකට යටත් ව විධිමත් ආයෝජන සැලසුමක් සහිත ව මුදල් ස්වාරක්ෂකය පවත්වා ගෙන යෑම කළ යුතු වේ.

මූලාශ්‍ර


1. Cruz, P., & Koc, F. (2018). “The Liquidity Buffer Practices of Public Debt Managers in OECD Countries”, OECD Working Papers on Sovereign Borrowing & Public Debt Management No. 09.
2. Hurcan, Y., Koc, F., and Balibec, E. (2020). How to Set Up a Cash Buffer: A Practical Guide to Developing & Implementing a Cash Buffer, Note 20/04, Fiscal Affairs Department, IMF.
3. Fainboim, I., Saxena, S., & Williams, M. (2020). “How to Develop a Framework for the Investment of Temporary Government Cash Surpluses”, Note 20/03, Fiscal Affairs Department, IMF.
4. වාර්ෂික වාර්තාව 2023, මුදල් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය

ගෙවීමක් යනු සාමාන්‍යයෙන් භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීම මත හටගත් මූල්‍යමය වගකීමක් පියවීම සඳහා මුදල් හෝ මුදල් නොවන ගෙවීම් උපකරණයක් (Non-Cash Payment Instruments) භාවිත කරමින් එක් පාර්ශ්වයක් විසින් තවත් පාර්ශ්වයකට වටිනාකම පැවරීමකි. පුද්ගලයන් සහ ව්‍යාපාර ආයතන, බැංකු, රජයන්, මහ බැංකු වැනි ආර්ථික නියෝජිතයන් විසින් ගෙවීම් සිදු කිරීමට හෝ මුදල් හුවමාරු කිරීමට ගෙවීම් සේවා මගින් හැකියාව ලබා දෙයි. කාර්යක්ෂම සහ ස්ථායී ජාතික ගෙවීම් පද්ධතියක් ආර්ථික නියෝජිතයන් අතර සුමටව මුදල් ගලා යෑම තහවුරු කරන අතර, ඉන් පෙරළා සමස්ත ආර්ථිකයට ම ප්‍රතිලාභ අත් කර දෙයි. මුදල් පැවරීම සහ ගෙවීමේ වගකීම් පියවීම සඳහා මුදල් නොවන ගෙවීම් උපකරණ සහ පද්ධති ක්‍රමික ව ජනප්‍රසාදය ලබා ගැනීම, එම උපකරණ සහ පද්ධතිවල කාර්යක්ෂමතාවයට හේතු වේ.

සෑම ආර්ථික කටයුත්තක දී ම නියමිත වේලාවට මුදල් හුවමාරුව සම්පූර්ණ වීම අවශ්‍ය වන හෙයින්, ආර්ථික සංවර්ධනය උදෙසා කාර්යක්ෂම සහ ස්ථායී මූල්‍ය පද්ධතියක් පූර්ව අවශ්‍යතාවකි. මූල්‍ය පද්ධතියක කාර්යක්ෂමතාව සහ ස්ථායීභාවය ජාතික ගෙවීම් පද්ධතියේ සහ එහි සංවර්ධනයන්හි ශක්තිමත්භාවය මත විශාල වශයෙන් රඳා පවතියි. ගෙවීම්/නිෂ්කාශන පද්ධතියක බිඳවැටීමක් තුළින් මූල්‍ය පද්ධතිය තුළ කම්පන ඇති කිරීමට ඉඩ ඇත.

මූල්‍ය පද්ධති ස්ථායිතාව සහ මූල්‍ය ප්‍රතිපත්තිය[1] ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ගෙවීම් පද්ධතියෙහි ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාතික ගෙවීම් පද්ධතිය නියාමනය සහ අධීක්ෂණය කරනු ලබයි. එමෙන් ම, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ගෙවීම් පද්ධතියේ සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාව සහ ස්ථායීභාවය වැඩි දියුණු කිරීමේ අරමුණැතිව, ජාතික ගෙවීම් පද්ධතිය ප්‍රවර්ධනය කිරීමෙහිලා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරයි.

ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය අඛණ්ඩ ව වැඩි දියුණු වෙමින් පවතී. වත්මන් යුගයේ දී, නව ගෙවීම් තාක්ෂණයන් හඳුන්වාදීමත් සමඟ, පුරවැසියන් සඳහා අඩු පිරිවැයකින් යුත් පහසුවෙන් සිදු කළ හැකි ගෙවීම් ක්‍රම ඉදිරිපත් කරමින්, ජාතික ගෙවීම් පද්ධතියේ විකාශනය වේගවත් ව සිදු වේ. මෙම ගෙවීම් පද්ධතිවල වර්ධනයන්හි උපරිම ප්‍රතිලාභ නෙළා ගනු පිණිස, පුද්ගලයන් සහ ආයතනවලට ඔවුන්ගේ වුවමනාවන් ඵලදායී ලෙස තෘප්තිමත් කර ගැනීමට ගෙවීම් සේවා උපයෝගී කර ගැනීමට හැකි වන සේ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. 2023 වසර වන විට ශ්‍රී ලංකාවේ තිබෙන ගෙවීම් සේවා සහ උපකරණ පිළිබඳ විස්තරයක් මෙහි දී ඉදිරිපත් කෙරේ.

---

1. මූල්‍ය ප්‍රතිපත්තිය යනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිල ස්ථායිතාව සහ මූර්ත ආර්ථිකයේ ස්ථායීතාව වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් සැපයුම සහ පොළී අනුපාත කළමනාකරණය කර ගැනීම තුළින් ක්‍රියාත්මක කරනු ලබන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය යි.

## ශ්‍රී ලංකාවේ විශාල වටිනාකම් සඳහා වූ

# ගෙවීම් පද්ධතිය වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය හඳුන්වා දීම

- විශාල වටිනාකම් සඳහා වූ ගෙවීම් පද්ධතියක් යනු බැංකු, පුද්ගලයන්, සමාගම් වැනි ආයතන අතර ඉහළ වටිනාකමකින් යුත් ගෙවීම් සිදු කිරීමට පහසුකම් සලසන පද්ධතියකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හිමිකාරීත්වය දරනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන තත්කාලීන දළ පියවීම් (Real Time Gross Settlement/ RTGS) පද්ධතිය රටෙහි පවත්නා එක ම විශාල වටිනාකම් සඳහා වූ ගෙවීම් පද්ධතිය වේ. RTGS පද්ධතිය යටතේ පියවීම "තත්කාලීන" (Real Time) සහ "දළ පදනම[1]" (Gross Basis) මත සිදු කෙරේ.

### RTGS පද්ධතිය පිළිබඳ කරුණු

- මෙය RTGS පද්ධතියේ සහභාගීකරුවන්ගේ[2] පියවීම් ගිණුම්වල ඇති මුදල් භාවිත කරමින් එක් එක් ගෙවීම් උපදෙස තනි තනිව ක්‍රියාත්මක කරන සහ නැවත අවලංගු කළ නොහැකි ලෙස පියවන විද්‍යුත් මුදල් පියවීම් පද්ධතියකි.

- RTGS පද්ධතිය යනු ලංකාසෙට්ල් (LankaSettle) පද්ධතිය යනුවෙන් හැඳින්වෙන ප්‍රධාන පියවීම් පද්ධතියේ අඩංගු එක් පද්ධතියක් වන අතර, ලංකාසෙට්ල් පද්ධතියෙහි මුදල් හුවමාරුව RTGS හරහා සිදුවන අතර රජයේ සුරැකුම්පත් ගනුදෙනු ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය හරහා සිදු වේ.

- RTGS පද්ධතිය තුළ, ඕනෑම අගයක මුදල් ගනුදෙනු ඉහළ සුරක්ෂිතභාවයක් සහ කාර්යක්ෂමතාවක් සහිතව විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ සිදු කළ හැකි ය.

---

1. දළ පදනම මත පියවීම යනු සෑම ගෙවීම් උපදෙසක් ම අනෙකුත් කිසිදු ගනුදෙනුවක් සමඟ සම්බන්ධ කිරීමෙන් නැතහොත් ශුද්ධ අගය ගණනය කිරීමකින් තොර ව තනි තනි ව ගනුදෙනු ලෙස සලකා පියවීම යි.
2. RTGS පද්ධතියෙහි වත්මන් සහභාගීකරුවන් වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සියලු ම ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු ක්‍රමය.

- RTGS පද්ධතිය 2003 සැප්තැම්බර් මාසයේ දී මෙහෙයුම් ආරම්භ කරන ලද අතර, ලංකාසෙක්‍යු පද්ධතිය 2004 පෙබරවාරි මාසයේ දී මෙහෙයුම් ආරම්භ කරන ලදී.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන RTGS පද්ධතිය, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධානවලින්, 2005 අංක 28 දරන ගෙවීම් සහ බේරුම් කිරීමේ පද්ධති පනතෙන් සහ සියලු සහභාගීකරුවන් අනුකූල විය යුතු පරිපූර්ණ පද්ධති රීති සමුදායකින් පාලනය කෙරේ.

### RTGS පද්ධතියේ මෙහෙයුම්

- RTGS පද්ධතිය සියලු ම බැංකු ව්‍යාපාර දිනවල දී පෙ.ව. 8.00 සිට ප.ව. 4.30 දක්වා ක්‍රියාත්මක වේ.

- RTGS පද්ධතියට "ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය විදුලි සංදේශනය සඳහා වූ එකමුතුව (Society for Worldwide Interbank Financial Telecommunication/SWIFT)" යන ජාලය ඔස්සේ ගෙවීම් උපදෙස් යොමු කෙරෙන අතර, ගෙවීම් තහවුරු කිරීම් ද එම ජාලය ඔස්සේ ම සහභාගී කරුවන්ට ආපසු යවනු ලැබේ.

- RTGS පද්ධතිය තුළින් ඕනෑ ම අගයක මුදලක් පැවරිය හැකි ය. ඇතැම් රටවල විශාල වටිනාකම් සහිත ගෙවීම් පද්ධති මත අවම ගනුදෙනු වටිනාකම් සීමා පනවා ඇතත්, ශ්‍රී ලංකාවේ RTGS පද්ධතියට නිශ්චිත අවම ගනුදෙනු වටිනාකමක් නොමැත. කෙසේ වෙතත්, සුළු වටිනාකම් සහිත ගෙවීම් "සුළු පරිමාණ ගෙවීම් පද්ධති" තුළින් වඩා අඩු පිරිවැයකට පහසුවෙන් සහ කාර්යක්ෂමව සිදු කළ හැකි බැවින්, RTGS පද්ධතිය සාමාන්‍යයෙන් භාවිත කෙරෙනුයේ විශාල වටිනාකම් සහිත ගනුදෙනු සඳහා ය.

- සහභාගීකරුවන්ට RTGS පද්ධතිය තුළින් ඉදිරි දින 10ක් දක්වා සිදුකරන ගෙවීම් සඳහා අදාළ වන

ගෙවීම් උපදෙස් පද්ධතිය වෙත යොමු කිරීමේ හැකියාව පවතියි.

- RTGS පද්ධතිය තුළ සිටින ඕනෑ ම සහභාගීකරුවෙකුගේ ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් පියවීම් ක්‍රියාවලියට සිදු වන බාධාවන් මග හැරීමට, RTGS පද්ධතිය විසින් සියලු සහභාගීකරුවන්ට ලංකාසෙක්‍යු පද්ධතිය තුළ තිබෙන පිළිබැඳුමක් නොමැති රාජ්‍ය සුරැකුම්පත්වලට[4] එරෙහි ව, කිසිදු ගාස්තුවකින් තොර ව, එක් දින ද්‍රවශීලතා පහසුකම (Intra-day Liquidity Facility/ILF)[5] සපයනු ලබයි. එම පහසුකම ලබා ගැනීමට ඉදිරිපත් කරන රජයේ සුරැකුම්පත්වල හිමිකාරීත්වය අදාළ සහභාගීකරුවා සතු විය යුතු ය.

4. ණය/ මූල්‍ය වගකීම් සඳහා ඇපයට තබා නොමැති රාජ්‍ය සුරැකුම්පත්.
5. RTGS සහභාගීකරුවන් වෙත තාවකාලික ව ලබා දෙන පොලී රහිත ණය පහසුකම.



# සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ උපකරණ

සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ උපකරණ මගින් පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල සුළු පරිමාණ ගෙවීම් අවශ්‍යතා සපුරාලනු ලබයි. චෙක්පත් හරහා ගනුදෙනු කිරීම, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා කරන මුදල් යැවීම්, අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම යෙදවුම් හරහා සිදුකරන ගෙවීම්, ගෙවීම් කාඩ්පත් හරහා සිදුකරන ගෙවීම් වඩාත් සුලභ වශයෙන් භාවිතා වන සුළු පරිමාණ ගෙවීම් අවශ්‍යතා වේ. ඉහත අවශ්‍යතා සපුරාගැනීමට ඇති පද්ධති සහ උපකරණය සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ උපකරණ ලෙස හඳුන්වයි. තවද, දිවයින පුරා විහිදී ඇති තැපැල් කන්තෝරු මගින් මුදල් ඇණවුම් වැනි සේවාවන් හරහා ද මුදල් හුවමාරු කිරීමට සහ ගෙවීම් සිදු කිරීමට හැකියාව තිබේ.


## චෙක්පත්

- චෙක්පත් යනු වඩාත් ම පුළුල් ලෙස රට තුළ භාවිත කෙරෙන මුදල් නොවන සුළු පරිමාණ ගෙවීම් උපකරණය වන අතර, රට පුරා ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයන් විසින්, චෙක්පත් පුළුල් වශයෙන් පිළිගනු ලැබේ.
- චෙක්පතක් යනු අණකරු හෝ අණකරු වෙනුවෙන් අත්සන් කිරීමට අවසරය ලද වෙනත් ඕනෑම පුද්ගලයකු විසින් අත්සන් කරන ලද, අණකරුගේ නියමයට හෝ දරන්නාට නිශ්චිත මුදලක් ගෙවීම සඳහා බැංකු වෙත ලබා දෙන කොන්දේසි විරහිත නියමයකි.
- බලපත්‍රලාභී වාණිජ බැංකුවල ජංගම ගිණුම් හිමියන්ට පමණක් චෙක්පත් නිකුත් කළ හැකි ය.
- ජංගම ගිණුම් හිමියන්ට, බැංකුවෙහි පවත්වා ගෙන යන ඔවුන්ගේ ජංගම ගිණුම්වල ශේෂයන්ට/අනුමත කරන ලද මූල්‍ය සීමාවලට යටත්ව චෙක්පත් නිකුත් කිරීම සඳහා සම්මත ආකෘතියකින් යුත් නිශ්චිත චෙක්පත් ගණනකින් සමන්විත චෙක්පොතක් ලබා දී ඇත.

# ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය

SLIPS යනු LPPL විසින් මෙහෙයවනු ලබන විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකමකි. ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශන ආයතනය (Sri Lanka Automated Clearing House/SLACH) විසින් 1993 වර්ෂයේ දී මංගත නොවන (off-line) ගෙවීම් පද්ධතියක් ලෙස SLIPS හඳුන්වා දෙන ලදී. 2002 වසරේ (SLACH) මෙහෙයුම් කටයුතු LPPL වෙත පැවරීමෙන් පසු, SLIPS මෙහෙයුම් කටයුතු ද LPPL වෙත පවරන ලදී.

SLIPS හි ද්විතියික සහභාගීකරුවන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව සහ LPPL විසින් අනුමත කරන ලද ප්‍රාථමික සාමාජිකයෙකුගේ RTGS ගිණුම ඔස්සේ ශුද්ධ ශේෂයන් පියවීමට කටයුතු සූදානම් කර තිබෙන අනෙකුත් මූල්‍ය ආයතනයන් ය.





කඩඉම් කාලයට පෙර සිදු කරන ලද SLIPS ගනුදෙනු එම දිනයේ දී ම (T+0 පදනම මත) පියවනු ලබන අතර, කඩඉම් කාලයට පසුව සිදු කරන ගනුදෙනු පසුව එළැඹෙන දිනයේ දී (T+1) පියවනු ලැබේ.

RTGS පද්ධතිය තුළ සහභාගීත්වය දරන බලපත්‍රලාභී බැංකු SLIPS හි ප්‍රාථමික සහභාගීකරුවන් වේ. (SLIPS හා අදාල බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ශේෂයන් RTGS පද්ධතිය තුලින් පියවනු ලබයි.)

ඉදිරියට ව්‍යාපාරික දින 14ක් දක්වා සිදුකළ යුතු ගනුදෙනු සඳහා ගෙවීම් උපදෙස් පිළිගැනීමට මෙම පද්ධතියට හැකියාව ඇත.

වැටුප්, බිල්පත් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් වැනි ආවර්තිත ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් SLIPS භාවිත කෙරේ.

## SLIPS ගනුදෙනු ක්‍රියාවලිය



# ගෙවීම් කාඩ්පත්

- ගෙවීම් කාඩ්පත් මගින් කාඩ්පත් හිමියන්ට තම ගිණුම වෙත හෝ නැතහොත් කාඩ්පතට සම්බන්ධ කරන ලද තැන්පත් කළ අගයක් වෙත පිවිස මුදල් ලබා ගැනීමට සහ/හෝ භාණ්ඩ සහ සේවා සඳහා ගෙවීම් සිදු කිරීමට පහසුකම් ලබා දෙයි. උදා: හර කාඩ්පත්, ණය කාඩ්පත්, අගය රාශිගත කාඩ්පත්
- මෙම ගෙවීම් කාඩ්පත්, විකුණුම්පළ (Point Of Sales/ POS) ගෙවීම් යන්ත්‍ර මගින් (POS යනු කාඩ්පතින් ගෙවීම් සිදු කිරීම සඳහා භාවිත කරනු ලබන විද්‍යුත් උපාංගයකි), වෙළඳ ස්ථානවල දී ගෙවීම් සිදු කිරීම සඳහා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් (ATMs) මුදල් ලබා ගැනීම සඳහා භාවිත කළ හැකි ය.
- "කාඩ්පත නොමැතිව සිදු කරන (Card Not Present)" ගනුදෙනු යනුවෙන් හැඳින්වෙන, අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ සහ සේවා (වෙළඳ වෙබ් අඩවි තුළින්) මිල දී ගැනීමට ගෙවීම් කාඩ්පත් භාවිත කළ හැකි අතර, මෙහි දී POS යන්ත්‍රයක දී මෙන් ගෙවීමක් සිදු කිරීමට ගෙවීම් කාඩ්පත භෞතික වශයෙන් ඉදිරිපත් නොකෙරෙන අතර ගෙවීම් කාඩ්පතෙහි තොරතුරු පමණක් ගෙවීම් කවුළුවෙහි ඇතුළත් කෙරේ.
- ශ්‍රී ලංකාවේ ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන් විසින් වීසා (VISA), මාස්ටර්කාඩ් (Mastercard), ඇමෙක්ස් (AMEX), යූනියන්පේ (UnionPay) වැනි ජාත්‍යන්තර කාඩ්පත් යෝජනා ක්‍රම යටතේ ගෙවීම් කාඩ්පත් නිකුත් කරන අතර, ශ්‍රී ලංකාව 2019 වර්ෂයේ දී ලංකාපේ/ ජේසීබී (JCB) යන සන්නාමය යටතේ ජේසීබී ඉන්ටර්නැෂනල් (JCB International) සමාගම සමග හවුලකාරීත්වයෙන් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය (National Card Scheme/NCS) දියත් කළේ ය.



- ගෙවීම් කාඩ්පත් මගින් ශ්‍රී ලංකාව තුළ මෙන් ම විදේශයන්හි දී ද POS යන්ත්‍ර මගින් භාණ්ඩ සහ සේවා සඳහා ගෙවීම් සිදු කිරීමට මෙන් ම, ATM වලින් මුදල් ලබා ගැනීමට ද භාවිත කළ හැකි ය.
- කාඩ්පත් හිමියන් විදේශ සංචාරයක යෙදෙන්නේ නම් සහ විදේශයක දී මෙම කාඩ්පත භාවිත කරන්නේ නම්, ඒ පිළිබඳ ව කල් තබා කාඩ්පත් නිකුත් කරන්නා දැනුවත් කිරීම බොහෝ කාඩ්පත් නිකුත් කරන්නන්ගේ අවශ්‍යතාවක් වේ.
- විදේශයක දී සිදු කරන සියලු ගනුදෙනු, අදාළ කාඩ්පත් යෝජනා ක්‍රමය විසින් අනුගමනය කරනු ලබන විනිමය අනුපාතික භාවිත කරමින් දේශීය ව්‍යවහාර මුදලට හැරවීමෙන් පසු හර කරනු ලැබේ.
- 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා දී තිබෙන ආයතනවලට පමණක් ශ්‍රී ලංකාව තුළ ණය කාඩ්පත්, හර කාඩ්පත්, අයභාර කාඩ්පත් සහ අගය රාශිගත කාඩ්පත් නිකුත් කළ හැකි වේ.
- 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීමට පහත ආයතන සුදුසුකම් ලබයි.
  - බලපත්‍රලාභී වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
  - 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශන පනත (සංශෝධිත) අනුව නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ ජංගම දුරකථන සේවා සපයන ක්‍රියාකරුවෙකු, සහ
  - 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අර්ථය තුළ ඇපයෙන් සීමිත සමාගමක්, අක්වෙරළ සමාගමක් නැතහොත් විදේශ සමාගමක් හැරුණු කොට, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති, අවම වශයෙන් රුපියල් මිලියන 150ක ක්ෂය නොවූ ප්‍රාග්ධනයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද වෙනත් ප්‍රමාණයක ක්ෂය නොවූ ප්‍රාග්ධනයක් ඇති සමාගම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ගෙවීම් සේවා සඳහා මාර්ගෝපදේශය, ශ්‍රී ලංකා මහ බැංකුව





# ඓතිහාසික ලෝක වෙළෙඳ ප්‍රවණතා හා ශ්‍රී ලංකාවේ වෙළෙඳාම

**අරුණ ශාන්ත**
**කෞතුකාගාර පාලක, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව**

**හැඳින්වීම**

කාලය හා අවකාශයට සාපේක්ෂව පෙර - අපර දෙදිග විවිධ රාජ්‍යවල මැදිහත්වීමෙන් ගොඩනැගුණු ඓතිහාසික ලෝක වෙළෙඳ ප්‍රවණතා පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු කිරීම හා එකී ප්‍රවණතා ශ්‍රී ලාංකේය වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය කෙරෙහි බලපෑ ආකාරය සැකවින් විස්තර කිරීම මෙම ලිපියෙන් අපේක්ෂා කරයි. එය මෙරට දේශීය - විදේශීය වෙළෙඳ මෙන් ම ආර්ථික ඉතිහිසය පුළුල් ලෙස විශ්ලේෂණය කිරීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් ප්‍රවේශයක් නිර්මාණය කර දෙයි. ඒ අනුව, යටත් පිරිසෙයින් ඉපැරණි ලෝක ශිෂ්ටාචාරවල ආරම්භක යුගයේ සිට ඍජු නාවික ගමන් ඔස්සේ සියලු මහාද්වීප එක ම වෙළෙඳ ජාලයකට සම්බන්ධ වූ ක්‍රි.ව. පහළොස් වන සියවස අවට කාල පරිච්ඡේදය දක්වා යුගය පිළිබඳ මෙහි අවධානය ලක් කර තිබේ. මන්දයත් එකී කඩයිම සැලකෙන්නේ වර්තමාන ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රවාහය නිර්මාණය වීමට ඇවැසි පදනම සැකසුණු කාල පරිච්ඡේදය වශයෙනි. ඒ අනුව, සැබවින් ම මෙහි 'ලෝක වෙළෙඳ ප්‍රවණතා' යන්නෙන් අදහස් කෙරෙනුයේ පැරණි ලෝකයේ පැවති වෙළෙඳ-වාණිජ ක්‍රියාවලියයි.


**නාගරික ශිෂ්ටාචාර හා දුරැකතර වෙළෙඳාම**

මිනිසා සත්ත්ව පාලන හා කෘෂි සමාජයෙන් ඔබ්බට නාගරික සභ්‍යත්වයක් කරා ලඟාවීම සෙසු සමාජායතනික අංශවල මෙන් ම ආර්ථික ක්‍රියාවලියෙහි ද නව පිම්මක් ඇති කළේ ය. ප්‍රමුඛ තාක්ෂණික මාධ්‍ය පසුබිම් කොට ගෙන සංස්කෘතික අවධි සැලකිල්ලට ලක් කිරීමේ දී හමුවන 'නව ශිලා යුගය' මෙහි පූර්ව ලක්ෂණ පහළ කළ අවස්ථාව ලෙස සැලකෙන අතර, එය යැපුම් අවශ්‍යතාවලින් ඔබ්බට අතිරික්ත නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමුවූ අවධිය ලෙස පිළිගැනීමට ලක්ව ඇත. මේ හා බැඳි සමස්ත ක්‍රියාවලිය 'නියෝලිතික විප්ලවය' (Neolithic revolution) ලෙස හැඳින්වීමෙන් ම, මෙකී පරිවර්තනයේ ස්වරූපය වඩාත් අවබෝධ කොට ගත හැකි ය. ශිෂ්ටාචාරගත අවධියේ දී කෘෂි හා සත්ත්ව මෙන් ම සෙසු නිෂ්පාදනවල අතිරික්තය කෙරෙහි විශේෂ අවධානය යොමු වූ අතර, අතිරික්තය අර්ථවත් ලෙස කළමනාකරණය කිරීම ඔවුන් සතු ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකී ය. එහි වඩාත් සුවිශේෂී අංගයක් නම්, වෙළෙඳාමයි. 'දුරැකතර වෙළෙඳාම' යටත් පිරිසෙයින් යම් සමාජයක්, නාගරික සභ්‍යත්වයක් ලෙස හඳුනා ගැනීම කෙරෙහි පදනම් වෙන ප්‍රධාන නිර්ණායකයක් වශයෙන් හඳුනා ගෙන ඇත.

ඉපැරණි ලෝකයට අයත් නාගරික සමාජ නැතහොත් ශිෂ්ටාචාර නියෝජනය කරන මෙසපොතේමියානු (ක්‍රි.පූ.10,000) හා ඊජිප්තු ශිෂ්ටාචාර (ක්‍රි.පූ. 8,000) සැලකීමේ දී ඒවා නව ශිලා අවධියේ සිට දුරැකතර වෙළෙඳ කටයුතුවල නියැලුණු බවට පැහැදිලි සාධක

හමුව තිබේ. ගංගා නිම්න පසුබිම් කොට ගෙන වර්ග කිලෝමීටර් දහස් ගණනක් දුරට ව්‍යාප්ත ව තිබීම හේතුවෙන් මේවායේ අභ්‍යන්තර වෙළෙඳ කටයුතු වුව ද පුළුල් පරාසයක පැතිර පැවති බව නිසැක ය. පසුකාලීන පැනනැගි චීනයේ හොයැං-හෝ ශිෂ්ටාචාරය (ක්‍රි.පූ. 7,000) හා ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ක්‍රි.පූ. 5,000) ඇසුරෙන් ද මෙකී ලක්ෂණය හඳුනා ගැනීමට පුළුවන. විශේෂයෙන් ම මෙසපොතේමියානු හා ඊජිප්තු ශිෂ්ටාචාර සිය අභ්‍යන්තර සීමාවෙන් ඔබ්බට නැතහොත් අන්තර් ශිෂ්ටාචාර අතර සමාජායතනික සබඳතා ගොඩනගා ගැනීම් පිළිබඳ පැහැදිලි සාධක හමුව තිබීමෙන්, මෙය අන්තර් වෙළෙඳ ප්‍රවණතා නිර්මාණය වීම පිළිබඳ පෙරනිමිති පහළ අවධිය වශයෙන් හැඳින්විය හැකි ය. විශේෂයෙන් ම මෙසපොතේමියාවට අයත් හසුනා, සමරා, ජෙරිකෝ වැනි නගර ක්ෂේත්‍ර ආශ්‍රිත පර්යේෂණවලින් මේ පිළිබඳ කුතුහලය උපදවනසුළු හඳුනා ගැනීම් රැසක් සිදුව ඇත.

ආසියානු කලාපය සැලකීමේ දී ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් දොලවීර, චන්හුදාරෝ වැනි වෙළෙඳ නගර හා දෝතාල් නම් ප්‍රධාන වරාය නගර ද සමකාලීන සෙසු ශිෂ්ටාචාර අතර පැවති වෙළෙඳාම පිළිබඳ වැදගත් කරුණු රැසක් අනාවරණය කරයි. යටත් පිරිසෙයින් ක්‍රි.ව. 2000 පමණ වන ඊජිප්තු හා නැගෙනහිර අප්‍රිකාව සිට අරාබි මුහුද හරහා අර්ධද්වීපික ඉන්දියාවේ බටහිර කලාපය දක්වා විහිද ගිය 'සුවඳ ලාටු වෙළෙඳ මාර්ගය' (Incense trade route) ලෙස හඳුන්වන වෙළෙඳ ප්‍රවාහය මෙකී ශිෂ්ටාචාර හෝ ඒවායේ පිරිහීමෙන් ගොඩනැගෙන පශ්චාද් රාජ්‍ය එකිනෙක සම්බන්ධ කරන්නට ඇති බව නිසැක ය.



ඊජිප්තු සුසාන ගර්භයක පිහිටි සමකාලීන වෙළෙඳපොළක ක්‍රියාකාරීත්වය ප්‍රකට කෙරෙන සිතුවමක්

(උපුටාගැනීම ; https://commons.wikimedia.org)

ඉන්දියාවේ දෙවන නාගරී ශිෂ්ටාචාරය සැලකෙන 'ගංගානම් නිම්න ශිෂ්ටාචාරය' නොහොත් බෞද්ධ සාහිත්‍යයේ එන සොළොස් මහා ජනපද නගරායනය ඉන්දියානු කලාපයේ මෙකී ප්‍රවණතා වඩාත් තහවුරු කළ සභ්‍යත්වය ලෙස සැලකිය හැකි ය. බෞද්ධ හා ජෛන සාහිත්‍යයේ එන සමකාලීන වෙළෙඳාම හා බැඳි විස්තරවලින් මේ පිළිබඳ සප්‍රමාණික නිදර්ශන පෙන්නුම් කෙරේ. බුදුන්වහන්සේ ජීවමානව වැඩවාසය කළ කාල පරිච්ඡේදය පුරාවට බුදුදහමේ ව්‍යාප්තියට හා පැවැත්මට අනුග්‍රහය දැක්වූවන්ගෙන් වැඩි කොටසක් මෙකී සමකාලීන වෙළෙඳ ප්‍රවාහය නියෝජනය කළ පිරිස් වන අතර, සුදත්ත (අනේපිඬු), මිගාර, කුම්භඝෝෂක, විශාඛා, සුජාතා යන අය විශාල ධනයක් හිමි වෛශ්‍ය හෙවත් වෙළෙඳ කුලයට අයත් ජන ප්‍රජාවක් වශයෙන් හඳුනාගත හැකි ය.

### ජාත්‍යන්තර වෙළෙඳ ජාලය සක්‍රීය වීම

යටත් පිරිසෙයින් ක්‍රි.පූ. තුන්වන සියවස අවට කාල පරිච්ඡේදය, අන්තර් රාජ්‍ය වශයෙන් ලෝක වෙළෙඳ ප්‍රවණතා සක්‍රීය වූ අවධිය ලෙස සැලකිය හැකි ය. ඉන්දියාවෙහි බිහි වූ මෞර්ය අධිරාජ්‍යයත් ග්‍රීක කලාප අභිබවමින් පෙරදිගට ව්‍යාප්ත වූ හෙලනික අධිරාජ්‍යයත් මිසරයේ පාරාවෝ අධිරාජ්‍යයත් චීනයේ හං රාජ වංශය යටතේ වර්ධනය වූ දේශපාලන බල ව්‍යාප්තියත් මෙකී ආර්ථික ප්‍රවාහයට නව මාවතක් විවර කළේ ය. යුරෝපීය රාජ්‍යවල අවධානය පෙරදිග වෙත යොමු වීම කෙරෙහි ඉවහල් වූ තීරණාත්මක ම සාධකය නම්, මහා ඇලෙක්සැන්ඩර් රජු (ක්‍රි.පූ. 356-323) විසින් මැසිඩෝනියාවේ සිට ඉන්දියාවේ වයඹ දිග කලාප දක්වා එල්ල කළ ආක්‍රමණයයි. මෙමගින් ඉන්දියාව ඔස්සේ යුරෝපය දක්වා වර්ධනය වෙමින් පැවති වෙළෙඳාමට වැඩි ඉඩකඩක් හිමි වූ ආකාරය හඳුනාගත හැකි ය. එපමණක් නොව පාරාවෝ අධිරජවරුන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වූ මිසරයේ ඇලෙක්සැන්ඩ්‍රියා නගරය පෙරදිග වෙළෙඳ භාණ්ඩ එක් රැස් කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත් විය. බටහිර සීමාවන්හි පැවති මිසරය පදනම් කර ගත් අප්‍රිකානු කලාපය හා යුරෝපයත් නැගෙනහිර කෙළවරේ පැවති චීනය ආදී රටවලුත් යා කරමින් ගොඩනැඟුණු මෙමෙ වෙළෙඳ ජාලයට, දම්වැලක පුරුක් මෙන් රටවල් හා වෙළෙඳ ශ්‍රේණි වශයෙන් ක්‍රම ක්‍රමයෙන් එකිනෙකට සම්බන්ධ වෙමින් පැවතිණි.

### ලෝක වෙළෙඳාමේ චීන භූමිකාව

ප්‍රස්තුත වෙළෙඳ ජාලයෙහි ප්‍රබලතම ක්‍රියාකාරිකයෙකු ලෙස හැඳින්වෙන්නේ චීනයයි. මේ වන විට එහි ගොඩනැගෙමින් පැවති දේශපාලන හා ආර්ථික ප්‍රවණතා මේ කෙරෙහි ඍජු ලෙස බලපෑම් ඇති කළේ ය. චීනයට පමණක් සීමා වී පැවති ඇතැම් භාණ්ඩ මධ්‍යාසියානු වෙළෙඳ මාර්ග ඔස්සේ යුරෝපය වෙත සේන්දුවීමේ ප්‍රවණතාව හං රාජ වංශ සමයේ දී තීව්‍ර විය. තම අධිරාජ්‍යයට උතුරින් පිහිටි තැනි බිම්වල ජීවත් වූ මොංගෝලියානු එඬේරුන් අශ්වයින් පිට නැගී චීනය දෙසට වැඩි වැඩියෙන් කඩා වදින්නට වූයේ මෙම අවධියේ සිට ය. චීන මහා ප්‍රාකාරය නිර්මාණය වන්නේ ද මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. මීට අමතර ව අධිරාජ්‍යවාදයේ නිම් වළලු පුළුල් කරමින් සිටි හං රාජ වංශිකයින්හට තම අධිරාජ්‍යය තහවුරු කර ගැනීම සඳහා ශක්තිමත් හමුදා සේනාංක අවශ්‍ය වූයේ ය. මන්දයත්, මෙම සේනාංක පැරණි යුද සේනාවට වඩා වේගවත් හා ශක්තිමත් විය යුතු ව තිබිණි. එබැවින් මධ්‍යාසියානු තණ බිම්වල ජීවත් වූ අශ්වයින් ලබා ගැනීමට චීනයට අවශ්‍ය විය. එහෙත් චීන රාජකීයයන් කොන්ෆියුසියස් දර්ශනය ගරු කළ පිරිසක් වූ බැවින් ඍජු වෙළෙඳ ගනුදෙනුවලට ප්‍රිය නොකළේ ය. මන්ද කොන්ෆියුසියස් දර්ශනය යටතේ නොකළ යුතු වෘත්තීන්ගෙන් පළමු වැන්න වූයේ වෙළෙඳාම බැවිනි.

උක්ත කරුණ හැරුණුවිට සමකාලීන වෙළෙඳ ප්‍රවාහයේ නැග්ම ද හේතුවෙන්, චීන අධිරජුට වෙළෙඳාම හා ඍජු ලෙස සම්බන්ධ වීම අත්හළ නොහැකි වගකීමක් බවට පත්වූ ආකාරය හඳුනාගත හැකි ය. ඒ සඳහා ඔවුන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත නම්, 'පඬුරු වෙළෙඳාම' (trading of gifts)යි. වෙළෙඳ කණ්ඩායම් හා දූතයින් විසින් ගෙන ආ වෙළෙඳ භාණ්ඩ මෙන් ම ඒ සඳහා අධිරජු ලබා දෙන ත්‍යාග ද පඬුරු වශයෙන් මෙහි දී සැලකිල්ලට ලක්ව ඇත. අධිරජු බැහැදැකීම සඳහා පැමිණෙන්නන් වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ගෙන ආ අතර, ඒවායෙහි වටිනාකම් අනුවත් ගෙන ආ රාජ්‍යයේ බලවත් භාවය අනුවත් ඔවුන් වෙත පඬුරු පිරී නැමීම චීන අධිරජුගේ සිරිත විය. පඬුරු වෙළෙඳාමේ දී හුවමාරු වූ භාණ්ඩ අතර චීනයේ නිෂ්පාදිත පට පිළි සඳහා ඉහළ ඉල්ලුමක් පැවති බව හඳුනා ගැනීමට පුළුවන. මීට අමතරව ඖෂධ, පිඟන් භාණ්ඩ, සායම් වර්ග ආදිය සඳහා ද ලෝක වෙළෙඳ පොළේ යහපත් ඉල්ලුමක් පැවතුණු බව නිසැක ය. අශ්වයින්, වයින්, ඔලිව් තෙල්, මැණික්, මුතු, ඇත් දළ ආදී භාණ්ඩ සඳහා මේ වන විට චීනය තුළ ද ඉතා තරගකාරී වෙළෙඳ පොළක් නිර්මාණය වී තිබුණේ ය.




චීන පට පිළි නිෂ්පාදනය විස්තර කෙරෙන සිතුවමක් (උපුටා ගැනීම: https://china.lu) පෙර-අපර දෙදිග යා කෙරෙන වෙළෙඳ මාර්ගය 'සේද මාවත' යන නමින් හැඳින්වීමටත් එය යටත් පිරිසෙයින් වසර 1500 දක්වා අවිච්ඡින්නව පැවතීමටත් චීන පට පිළි හේතු විණි යුරෝපය ප්‍රධාන අතීත ලෝකය ම වසඟ කරගත් මෙම නිෂ්පාදනය සොයා ලොව නන් දෙස වෙසෙන වෙළෙඳුන්ට සැතපුම් දහස් ගණනක් දුර ගෙවා චීනයට ම පැමිණීමට සිදුවූයේ එහි අනුකරණ නිෂ්පාදනයක් හෝ සාර්ථක කර ගැනීමට අන් කිසිඳු රාජ්‍යයක් අපොහොසත් වූ බැවිනි. වසර දහස් ගණනක් පුරා චීන අධිරජුන් විසින් පට පිළි නිෂ්පාදන අමුද්‍රව්‍ය හා තාක්ෂණය ලොවෙන් වසන් කර ගැනීමට සමත්වූ අතර, පට පනු කෝෂය මෙකී නිෂ්පාදනය සඳහා භාවිත කෙරෙන බව සෙසු ලෝකය දැන ගැනීම, මධ්‍යකාලීන යුගය දක්වා පමා වූ බව කියැ වේ.

**සේද මාවත**

මෙලෙස චීනයේ හා යුරෝපය අතර වැඩෙමින් පැවති වෙළෙඳ ප්‍රවාහයේ අග්‍ර ඵලය නම්, පෙර අපර දෙදිග යා කරමින් ඓතිහාසික සේද මාවත නිර්මාණය වීමයි. යටත් පිරිසෙයින් ක්‍රි.ව. උදාව අවට කාල පරිච්ඡේදයේ දී ආරම්භ වූ මෙය තවත් වසර 1500කට ආසන්න කාල පරිච්ඡේදයක් පුරා අවිච්ඡින්නව, පැරණි ලෝකයේ ප්‍රධාන අන්තර් ජාතික වෙළෙඳ ජාලය බවට පත් විය. ගොඩබිම් සේද මාවත ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශ ඔස්සේ මධ්‍යාසියානු කලාපය හරහා මැද පෙරදිගටත් එතැන් සිට කොන්ස්තන්තිනෝපලය දක්වාත් විහිද ගියේ ය. තවත් මගක් මිසරයේ ඇලෙක්සැන්ඩ්‍රියාව දක්වා වැටී තිබිණි. එහි සිට ආරම්භ වූ මුහුදු මාර්ග ඔස්සේ ඉතාලි හා සයිබීරියානු අර්ධද්වීපික කලාප වෙත පෙරදිග වෙළෙඳ භාණ්ඩ පැතිරී ගියේ ය. චීනයේ කැන්ටන් වරායේ සිට ආරම්භ වූ මුහුදු සේද මාවත දකුණු චීන මුහුද තරණය කරමින් මලක්කා සමුද්‍ර සන්ධියටත් එතැනින් බෙංගාල බොක්ක මුහුදු කලාපය හා අරාබි මුහුදටත් පර්සියන් බොක්ක හරහා මැද පෙරදිග කලාපයටත් තවත් මඟක් රතු මුහුද හරහා ඇලෙක්සැන්ඩ්‍රියාවටත් යොමුව පැවතිණි. ඉතා දිගු දුරක් ගෙවාලන මෙම වෙළෙඳ මාවත් යුගලය ඔස්සේ ගොඩනැගුනු මෙම වාණිජ ජාලයට යුගයෙන් යුගයට කරලියට පැමිණි රාජ්‍ය හා වෙළෙඳ ශ්‍රේණි ගණනාවක් වඩාත් සක්‍රීය ලෙස දායකවූ ආකාරය හඳුනාගත හැකි ය.

ඉන්දියාව, චීනයේ සිට විහිදී ගිය ගොඩබිම් හා මුහුදු සේද මාර්ගයන්හි ප්‍රධාන පාර්ශ්වකරුවන් බවට පත්වූ අතර, ලංකාව ද එහි සැලකිය යුතු භූමිකාවක් නිරූපණය කළේ ය. වයඹ දිග ඉන්දියානු වෙළෙඳ මාර්ග ඔස්සේ ඉන්දියාව ගොඩබිම් සේද මාවතට සම්බන්ධ වන විට බෙංගාල බොක්ක මුහුදු කලාපය හා අරාබි මුහුද ආශ්‍රිත ව පැවති නාවික තොටුපොළ මගින් මුහුදු සේද මාවතේ සාමාජිකයෙකු බවට පත් වූයේ ය. දිවයිනක් ලෙස පිහිටා තිබීමත්, කඩතොලු සහිත වෙරෙළ තීරය හේතුවෙන් සැකසී තිබූ ස්වභාවික වරාය හා තොටුපොළ පද්ධතියත්, ලංකාව මුහුදු සේද මාවතේ ප්‍රධාන නැවතුම්පොළක් බවට පත් කළේ ය. ඉන්දියානු සාගරය වෙත ප්‍රවේශ වන යාත්‍රිකයෙකු හට පෙරදිගට හෝ අපරදිගට ගමන් කිරීමේ දී ලංකාව වටා යාත්‍රා කිරීම අත්හල නොහැක්කක් විය. එහි දී ඔවුන් හට මෙරට නාවික තොටුපොළ භාවිත කිරීමට සිදු වූවා පමණක් නොව ඇතැම් නාවිකයින් හට මෙරට තුළ මාස කිහිපයක් නවාතැන් ගැනීමට ද සිදු වූ බව කියැ




සාගර හා ගොඩබිම් සේද මාර්ගය (උපුටා ගැනීම:https://transportgeography.org)

වේ. එබැවින් ලංකාව පෙර අපර දෙදිග වෙළෙඳාමේ ප්‍රධාන නැවතුම්පොළක් වූවා පමණක් නොව පහසුකම් සපයන කේන්ද්‍රස්ථානයක් බවට ද පත්වූ බව සහේතුක ව උපකල්පනය කළ හැකි ය.

**කුෂාණ රාජවංශය යටතේ වයඹ දිග ඉන්දියාවේ පිබිදීම**

ක්‍රිස්තු වර්ෂ උදාව අවට කාල පරිච්ඡේදය ලෝක වෙළෙඳ ජාලයෙහි නව ප්‍රවණතා කිහිපයක් ඉස්මතු වූ අවධියක් ලෙස සැලකිය හැකි ය. වයඹ දිග ඉන්දියානු කලාපයත් මධ්‍යාසියානු කලාපයෙහි කොටසකත් ව්‍යාප්ත වූ කුෂාණ අධිරාජ්‍යය මෙම වෙළෙඳ ක්‍රියාකාරීත්වය කෙරෙහි බෙහෙවින් උපස්ථම්භක වූ ආකාරය හඳුනා ගැනීමට පුළුවන. ආසියාකරයේ සිට ඉන්දියාව වෙත ප්‍රවේශ වීමට තිබූ කපොලු මාර්ග සියල්ල ම පාහේ මේ වන විට ද පාලනය කිරීමේ අවස්ථාව කුෂාණ රාජවංශය විසින් දිනා ගෙන තිබුණි. ඒ අනුව පෙෂාවෝර් හෙවත් පැරණි පුරුෂපුරය, තක්ෂිලා, කන්දහාර්, කාබුල්, කැෂ්ගාර්, බෝටාන් සමර්කාන්ඩ් ආදි වයඹ දිග ඉන්දියානු වෙළෙඳ නගර හා මධ්‍යාසියානු වෙළෙඳ නගර බොහොමයක් කුෂාණයන් සතු විය. මේවා සැලකෙන්නේ, ගොඩබිම් සේද මාවතේ ප්‍රධානත ම නැවතුම්පොළවල් වශයෙනි. මේ වන විට මැද පෙරදිග කලාපයෙහි විශාල භූගෝලීය කලාපයක් රෝමවරුන් සතුව පැවති බැවින්, චීනය හා රෝමය අතර සිදු වෙමින් පැවති සරුසාර



පළමු කණිෂ්ක රජු (ක්‍රි.ව. 127 -150) විසින් නිකුත් කළ රන් කාසි ප්‍රභේදයක්: මෙහි අභිමුඛයේ රජුගේ රූපය ද ප්‍රතිමුඛයේ බුදුන්වහන්සේගේ රූපය ද දක්වා ඇත. ප්‍රස්තුත කාසිය බුදුන්වහන්සේ මානවරූපී ලෙස නිරූපණය කළ පළමු අවස්ථාව ලෙස සැලකේ (උපුටා ගැනීම: https://en.wikipedia.org/wiki/Kanishka).

වෙළෙඳාමේ අතරමැදීත්වය කුෂාණවරුන්ට නිතැතින් ම උරුම වූ ආකාරය හඳුනා ගැනීමට පුළුවන. මෙම වෙළෙඳාම කොතරම් සාරවත් ලෙස පුළුල් ක්ෂේත්‍රයක පැතිර පැවතියේ ද යත්, කුෂාණ රාජවංශය විසින් නිකුත් කළ රන් කාසි ඉන්දියානු හා මධ්‍යාසියානු කලාපවලින් හමුව තිබීමෙන් අවබෝධ කරගත හැකි ය. කාසි නිෂ්පාදනය සඳහා රත්‍රන් භාවිත කර තිබීමෙන් පෙනී යන්නේ කුෂාණයන් සතු වූ ආර්ථික හැකියාවයි.

**රෝම වෙළෙඳ අධිපත්‍යය**

සමකාලීන වශයෙන් රෝමවරුන්ගේ අධිපරිභෝජන රටාව හා සුඛෝපභෝගී ජීවන පැවැත්ම ලෝක වෙළෙඳාම කෙරෙහි කෙතරම් තීරණාත්මක ලෙස බලපෑම් ඇතිකළේ ද යන්න, පෙරදිග ලෝකයේ බොහෝ රටවල් රෝමය සමග සෘජු වාණිජ සබඳතා අපේක්ෂාවෙන් පසු වීමෙන් පැහැදිලි කොට ගත හැකි ය. එහෙත් මේ වන විට රෝම වෙළෙඳාමේ පෙරදිග කේන්ද්‍රය බවට පත් ව තිබුණේ ඉන්දියාවයි. ඉන්දියාව සමග වෙළෙඳ ගනු දෙනුවල නිරත වූ රෝමවරුන් පෙරදිග භාණ්ඩ බොහෝමයක් ඉන්දියානු වෙළෙන්දන් හරහා එම තොටුපළවල දී හුවමාරු කර ගත් බවට සාක්ෂි, සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රයවලින් සපයාගත හැකි ය. රනින් හා රිදියෙන් කළ රෝම කාසි පෙරදිග ලෝකයේ විශේෂ ආකර්ෂණය දිනාගත් අතර ඒවා සඳහා පැවති ඉල්ලුම හේතුවෙන් මෙම කාසිවල අනුකරණ කාසි හා ව්‍යාජ කාසි නිෂ්පාදනය කෙරෙහි එකල සෙසු රාජ්‍ය පෙළෙඹුනු ආකාරය හඳුනා ගත හැකි ය. මෙකල රෝමවරුන් සමග වෙළෙඳාම කෙරෙහි පෙරදිග වැසියන් තුළ පැවති නොසන්සිඳෙන කැමැත්ත ලාංකිකයන් පිළිබඳ ව ද සාධාරණ වූවක් බව පෙනෙනුයේ, මහාවංස ටීකාව ගෙනහැර දක්වන විස්තර මෙම කාල පරිච්ඡේදය සමග මනාව ගැලපෙන බැවිනි.

මහාවංස ටීකා විස්තරය අනුව ක්‍රිස්තෝත්පත්තිය හා සමකාලීන ව මෙරට පාලකයා ලෙස කටයුතු කරනු ලැබූ භාතිකාභය රජු (ක්‍රි.පූ.20-ක්‍රි.ව.9) මහාසෑය හෙවත් රුවන්වැලිසෑයට කළ පූජාවක් පිළිබඳ කරන සඳහනක දී ටීකාකරුවා පෙන්වා දෙන්නේ 'රෝමනක්ඛ' නම් රටකට දූතයන් යවා රතු පබළු ගෙන්වා දැලක් ආකාරයෙන් වියා මහාසෑය වෙත පැළැඳවූ බවයි. මෙහි සඳහන් රෝමනුක්ඛ රට රෝමය විය හැකි යැයි බොහෝ පර්යේෂකයන්ගේ මතය වෙයි.. මෙම කාල පරිච්ඡේදයෙහි ම මෙරටින් රෝමයට ගිය දූත පිරිසක් පිළිබඳ ව ප්ලිනී විසින් රචිත 'නැචුරාලියා හිස්ටෝරියා' කෘතියෙහි විස්තර කෙරෙයි. මෙරටින් හමු වන රෝම කාසිවලින් වැඩි සංඛ්‍යාවක් රෝම අනුකරණ කාසි වුව ද හමුව ඇති නිර්ව්‍යාජ කාසි දෙවන ක්ලෝඩියස් (ක්‍රි.ව.268 -270) රාජ්‍ය සමයට අයත් වන බැවින්, යටත් පිරිසෙයින් ක්‍රි.ව. දෙවන සියවසේ පමණ වන විට හෝ මෙරට හා රෝමය අතර සෘජු වෙළෙඳ සබඳතා ගොඩනැගී පැවති බව උපකල්පනය කළ හැකි ය.



ගිනිකන්දක ක්‍රියාකාරීත්වය හේතුවෙන් විනාශයට පත්වුණු පොම්පේ නගරයෙන් සොයාගත් රෝම වෙළෙඳ තොටුපොළක් නිරූපිත බිතු සිතුවමක් (උපුටා ගැනීම :https://factsanddetails.com)

**යූනාන් රාජධානිය හා අග්නිදිග ආසියානු කලාපයේ වෙළෙඳ කටයුතු**

සුඛෝපභෝගී ජීවන පැවතුම් සහිත අධිරාජ්‍යයක් බටහිර දෙසින් වර්ධනය වීමත් නැගෙනහිර දෙසින් සීමිත වාණිජ ප්‍රතිපත්ති යටතේ සංවිධානය වූ එහෙත් ඇති වෙමින් පැවති ප්‍රවණතා හමුවේ සිය වාණිජ ප්‍රතිපත්ති පුළුල් කරමින් සිටි චීනය ඉදිරියත් ඉන්දියාව මෙම කලාප දෙකෙහි අතරමැදි වෙළෙඳ දැවැන්තයා ලෙස ඉදිරියට ඒමත් කාලීන වශයෙන් ඇති වූ බොහෝ වෙළෙඳ වාණිජ ක්‍රියාදාමයන් සඳහා බලපෑම් ඇති කළේ ය. ක්‍රි.ව. පළමු වන සියවස අග්නිදිග ආසියානු කලාපයෙහි යූනාන් නමින් රාජධානියක් ඉස්මතු වූ කාල වකවානුවයි. යූනාන් රාජධානිය චීනය සමග කළ ගනුදෙනු බොහෝමයක් පිළිබඳ විස්තර සමකාලීන චීන වාර්තාවල සටහන් ව ඇත. යූනාන්හි සිට චීනයට

ගිය දූත ගමන් මෙන් ම චීන අධිරජු විසින් ෆූනාන් රාජධානිය කරා යැවූ දූත ගමන් පිළිබඳ තොරතුරු ද ඒ අතර වඩාත් කැපී පෙනෙයි. මෙම රාජධානිය සමග ලාංකිකයන් ගනුදෙනු කළේ ද යන්න නිශ්චිත තොරතුරු හඳුනා ගැනීම දුෂ්කර ය. ඉන්දියාව හා චීනය අතර පැවති සාගරික වෙළෙඳාමේ අතරමැදිත්වය මේ වන විට ෆූනාන් රාජ්‍ය විසින් දිනා ගනිමින් පැවති බවට පැහැදිලි සාධක හඳුනා ගැනීමට පුළුවන. ඒ අනුව මෙලෙස ඉන්දියානු සහ අග්නිදිග ආසියානු කලාපයන්හි වර්ධනය වූ දේශපාලන හා ආර්ථික ප්‍රවණතා ලෝක වෙළෙඳ රටාවේ වෙනස්කම් ඇති කිරීම කෙරෙහි මුල් වූයේ ය.

## ගුප්ත රාජධානිය යටතේ ඉන්දීය වෙළෙඳාමේ වර්ධනය

ක්‍රිස්තු වර්ෂ තෙවන සියවසේ සිට පස් වන සියවස දක්වා වූ කාලය ඉන්දියානු අර්ධද්වීපයේ වෙළෙඳ කටයුතු විශාල දියුණුවක් අත්පත් කරගත් කාල පරිච්ඡේදයක් ලෙස සැලකිය හැකි ය. ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය මේ කෙරෙහි බෙහෙවින් ඉවහල් වූයේ ය. ඉන්දියාවේ බටහිර වෙරළ සිට නැගෙනහිර වෙරළ දක්වා වූ ගොඩබිම් කලාපය ගුප්ත අධිරාජ්‍යය සතු විය. එබැවින් මුහුදු මාර්ග උපයෝගී කර ගනිමින් වෙළෙඳ කටයුතුවල නිරත වූවන්ට අර්ධද්වීපික ඉන්දියාව වටා යාත්‍රා නොකොට ඉතා පහසුවෙන් බටහිර හා නැගෙනහිර වෙරළ තොටුපළ භාවිත කර ඉන්දියාවේ ගොඩබිම් වෙළෙඳ මාර්ග ඔස්සේ තම භාණ්ඩ ප්‍රවාහණය කිරීමේ හැකියාව උදා විය. නැගෙනහිර හා බටහිර අතර ගොඩබිම් වෙළෙඳ මාර්ග කොතරම් දියුණුව පැවතියේ ද යන්න පෙන්නුම් කෙරෙන එක් සාධකයක් නම්, මෙම වෙළෙඳ මාර්ග වැටී තිබූ ප්‍රදේශවල ආගමික මධ්‍යස්ථාන ලැබූ සීඝ්‍ර සංවර්ධනයයි. අජන්තා, එල්ලෝරා ආදි ආගමික සිද්ධස්ථාන බොහෝමයක් මේ අවධියේ දී විශාල දියුණුවක් අත් කර ගත්තේ එම ප්‍රදේශ හරහා වැටී තිබූ වෙළෙඳ මාර්ග හා එම මාර්ගයන්හි ගමන් ගත් වෙළෙන්දන්ගේ දායකත්වය හේතුවෙනි.

ගුප්ත අධිරාජ්‍යයේ ප්‍රබලත ම පාලකයෙකු ලෙස සලකන සමුද්‍රගුප්ත රජු (ක්‍රි.ව.335-375) විසින් නිකුත් කර ඇති අලහබාද් ප්‍රශස්තියෙහි 'සෛහලද්වීපය' නමනට කප්පම් ගෙවූ රාජ්‍යයක් ලෙස සඳහන් කර ඇත. මෙහි සෛහලද්වීපය ලෙස හඳුන්වා ඇත්තේ ශ්‍රී ලංකාවයි. ප්‍රශස්තිමය ස්වරූපයෙන් ලියා ඇති බැවින් අලහබාද් ලිපියේ ඇතැම් කරුණු සෘජුව පිළිගැනීම දුෂ්කර වන අතර ලංකාව ගුප්ත අධිරජුට කප්පම් ගෙව්වේ ය යන සඳහන අතිශයෝක්තියක් වීමට ද ඉඩ ඇත. සැබවින් ම මෙවැනි සඳහනකට කෙරෙහි හේතුව වන්නට ඇත්තේ, මේ වන විට ලංකාව ද සමකාලීන ආසියානු වෙළෙඳ ප්‍රවාහයේ සැලකිය යුතු භූමිකාවක් නිරූපනය කිරීම මෙන් ම ඉන්දියාව සමග ද සෘජු සබඳතා ගොඩනගා ගැනීම විය හැකි ය. එය වඩාත් පැහැදිලි වනුයේ දෙවන ජෙට්ඨතිස්ස රජු (ක්‍රි.ව.328-337) දවස ඉන්දියාවේ බුද්ධගයා වෙත ගිය ශ්‍රී ලාංකේය වෙළෙඳ කණ්ඩායමක් පිළිබඳව 'කාව්‍යරාජාවලිය' නමැති ග්‍රන්ථයේ කරන සඳහනකිනි. මීට අමතර ව කිත්සිරිමේඝ රජු දවස (ක්‍රි. ව. 301-328) බුද්ධගයාව වන්දනය සඳහා ගිය ශ්‍රී ලංකේය වන්දනාකරුවන් පිරිසකට විශ්‍රාම ශාලාවක් ඉදි කිරීම සඳහා සමුද්‍රගුප්ත අධිරජුගේ උපකාර ලබා ගත් බව චීන මූලාශ්‍රයක සඳහන් ව ඇත.



සමුද්‍රගුප්ත රජු විසින් නිකුත් කෙරුණු රන් කාසියක් (උපුටා ගැනීම : https://coinindia.com)

තව ද, මෙකල ලංකාව ඉන්දියාවේ නැගෙනහිර රාජධානි සමග ඉතා සමීප සබඳතාවක් පවත්වා ඇති බවට ද සාධක හමුව ඇත. මහසෙන් රජු (ක්‍රි.ව.278-301) විසින් කාලිංගය සමඟ ගෙන ගිය සබැඳියාව මෙවැන්නකට කදිම නිදසුනකි. මහසෙන් රාජ්‍ය සමයේ පැවති සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ පුත් කිත්සිරිමේඝ රජු (ක්‍රි.ව.304-332) කල හේමමාලා හා දන්ත යන රාජකීයයන් අත දළදා වහන්සේ ලක්දිවට වැඩමවනු ලැබී ය. මෙම සබඳතා සංස්කෘතික මුහුණුවරක් ගත්ත ද ආර්ථික වශයෙන් ද මෙම රාජධානි සමග සබඳතා පවතින්නට ඇති බව නිසැක ය. මෙවැනි තත්ත්වයක් ඉස්මතු වනුයේ නැගෙනහිර හා බටහිර ඉන්දියානු වෙරළ කලාප පදනම් කර ගනිමින් වර්ධනය වූ වෙළෙඳ වාණිජ රටාවේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් විය හැකි ය.

### රෝම අධිරාජ්‍යයේ බිඳ වැටීම

ක්‍රිස්තු වර්ෂ තුන් වන හා හතර වන සියවස් වන විට දැවැන්ත භූමි කලාපයක් වසා ගනිමින් පැතිර තිබූ රෝම අධිරාජ්‍යයේ ස්වර්ණමය අවධිය නිමාවට පත්වෙමින් පැවතිණි. පාලනයේ පහසුව සඳහා අධිරාජ්‍යය නැගෙනහිර හා බටහිර ලෙස බෙදීමට ලක් කළ ද, රෝමයෙහි පරිහානිය එයින් නොවැළැක්විය හැකි විය. ක්‍රි.ව. තෙවන හා සිව් වන සියවස් වන විට උතුරු යුරෝපාකරයේ සිට කඩා වැදුනු ගෝත්‍රිකයින්ගේ ආක්‍රමණවලට රෝම අධිරාජ්‍යය ගොදුරු වුණු ආකාරය හඳුනාගත හැකි ය. නැගෙනහිර කොටස ගෝත්‍රික ආක්‍රමණවල දරුණු පහරදීම්වලට ලක් නොවූව ද බටහිර කොටස මුළුමණින් ම පාහේ ගෝත්‍රික ආධිපත්‍යයට නතු විය. එබැවින් පෙරදිග හා යුරෝපය අතර ගොඩනැගී තිබූ සංකීර්ණ වෙළෙඳ ජාලයට මෙයින් තරමක බාධා එල්ල වූයේ ය. බටහිර අධිරාජ්‍යය පිරිහී ගිය ද, රෝමයේ නැගෙනහිර අධිරාජ්‍යය ක්‍රි.ව. පහළොස්වන සියවස දක්වා ම විවිධ පරිවර්තනවලට යටත් ව තවදුරටත් තම ස්වාධීනත්වය ආරක්ෂා කරගත් ආකාරය පෙන්නුම් කෙරේ. කොන්ස්තන්තිනෝපලය නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අග නගරය වූ අතර, පෙරදිග වෙළෙඳ භාණ්ඩ යුරෝපය වෙත බෙදාහැරි ප්‍රධානතම වෙළෙඳ නගරය වූයේ ද යුරෝපීයයන්ගේ සම්භාව්‍ය සංස්කෘතිය ආරක්ෂා කළ මධ්‍යස්ථානය බවට පත් වූයේ ද මෙයයි.

ඇලෙක්සැන්ඩ්‍රියා හා ටයර් ආදි තොටුපොළවල සිට යුරෝපය වෙත මුහුදු මගින් ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය ඉතාලි නගර ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ වෙළෙඳ සංගම් මගින් යුරෝපා ප්‍රදේශවලට බෙදා හැරියේ ය. මෙමගින් ඔවුන් ලැබූ ලාභ පසුකාලීන ව සුඛෝපභෝගී ජීවිත ගත කළ කලාව හා රසවින්දනය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක් වූ ජනතාවක් ඉතාලි ප්‍රදේශවල බිහිවීමට බලපෑ බවට මත පළ වී ඇත. නේපල්ස්, ප්ලෝරන්ස්, මිලාන්, ජිනෝවා, වැනීසිය, බොලොඤ්ඤා, පීසා ආදි නගර සරුසාර වෙළෙඳාමේ කේන්ද්‍රස්ථාන වූයේ ය. නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ වර්ධනයත් සමග යුරෝපය හා ආසියාව අතර වෙළෙඳ සබඳතා නැවත වරක් සක්‍රීය මට්ටමකට පත් විය. මෙම කාල පරිච්ඡේදය වන විට ඉරාන භූමි කලාපය පදනම් කර ගත් දෙවන පර්සියන් අධිරාජ්‍යය ඉදිරියට පැමිණෙමින් තිබුණේ ය.

### පර්සියානු සම්බන්ධය

පෙරදිග වෙළෙඳාමේ තරගකරුවෙකු බවට පත් වූ පර්සියන්වරු පිළිබඳව 'පෙරිප්ලස් ඔෆ් එරිත්‍රියන්', ප්‍රකෝපියස්ගේ 'පර්සියානු යුද්ධ' මෙන් ම කොස්මස් විසින් රචිත 'ටොපෝග්‍රැෆියා ක්‍රිස්තියානියාහි' ද විස්තර අන්තර්ගත ව ඇත. ඉතියෝපියානුවන් හා පර්සියානුවන් අතර ලක්දිව වෙළෙඳාම සඳහා පැවති තරගය ද මෙහි විස්තර කර තිබීම විශේෂත්වයක් ලෙස සැලකිය හැකි ය. මීට අමතර ව රෝම වෙළෙන්දන් චීන පට පිළි ලබා ගෙන ඇත්තේ ලංකාවේ සිට පැමිණි පර්සියානු වෙළෙන්දන්ගෙන් බව ප්‍රකෝපියස් සඳහන් කර ඇත. සොෆේටර් සහ වජ්‍රබෝධි හිමියන් ලංකාවට පැමිණි පර්සියානු වෙළෙන්දන් පිළිබඳ විස්තර කර ඇත. ඒ අතර එන, මැණික් මිල දී ගැනීම සඳහා ලක්දිව වරායන් වෙත සේන්දු වී තිබූ පර්සියානු නෞකා පන්සිය තිහක් පිළිබඳ ව වජ්‍රබෝධි හිමියන් සපයන විස්තරය කුතුහලය උපදවන සුළු ය. ලංකාවට හිමි ව තිබූ අශ්ව වෙළෙඳාමේ ඒකාධිකාරය මේ වන විට පර්සියානුවන් විසින් දිනා සිටි බවත් මෙරට සිටි පර්සියානු ක්‍රිස්තු භක්තිකයින් සඳහා පල්ලියක් ඉදි වී තිබූ බවත් ප්‍රෙස්බිටර්වරයෙකු සහ ඩිකන්ස්වරයෙකු පර්සියාවෙන් ම පත් කර එවා තිබූ බවත් ප්‍රකෝපියස් සඳහන් කර ඇත.

### ශ්‍රී විජය රාජ්‍යයේ නැගීම

ක්‍රිස්තු වර්ෂ හය වන හා හත් වන සියවස් ලෝක වෙළෙඳ රටාවේ වෙනස්කම් ගණනාවක් සිදු වූ වකවානුවකි. අග්නිදිග ආසියාවේ මෙතෙක් කලක් වැජඹෙමින් තිබූ ෆූනාන් රාජධානිය මේ වන විට මුළුමණින් ම පාහේ තම භූමිකාවෙන් ඉවත්ව ගොස් තිබුණි. එහෙත් ෆූනාන් සතු වූ කාර්යභාරය මේ වන විට වැඩෙමින් පැවති ශ්‍රී විජය නමැති දිවයින් රාජධානිය දිනා ගෙන තිබුණේ

ය. සුමාත්‍රා, ජාවා, බෝර්නියෝ හා සුලවෙසි දිවයින් දක්වා ම තොටුපළ පාලනය කිරීමේ හැකියාව ශ්‍රී විජයවරුන් සතු විය. චීනය ටාං රාජ වංශය යටතේ වෙළෙඳාම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේ ද මෙම වකවානුවේ සිට ය. මෙම සිදුවීම් අතර වඩාත් වැදගත්ම සිදුවීම, අරාබි අර්ධද්වීපය පදනම් කර ගනිමින් නිර්මාණය විය. ඒ අනෙකක් නොව ක්‍රි.ව. 570 දී සිදු වූ මොහොමඩ් නබිතුමාගේ උපතයි. එතුමා විසින් දේශනා කළ ඒකදේවවාදය පදනම් කර ගත් ඉස්ලාමය වෙත සමස්ත අරාබි අර්ධද්වීපය ම කෙටි කලකින් නැඹුරු වූයේ ය.

### ඉස්ලාමයේ ආරම්භය හා වර්ධනය

මොහොමඩ් නබිතුමාගේ මරණයෙන් පසු ඔහුගේ අනුගාමිකයින් විසින් ඉස්ලාමය වෙනත් භූගෝලීය කලාප කරා ගෙන ගියේ ය. ආක්‍රමණශීලී ස්වරූපයෙන් සිදු කළ මෙම ව්‍යාප්තිවාදී ප්‍රතිපත්ති හේතුවෙන් හත් වන සියවස අවසන් වන විට ඉස්ලාමය උතුරු අප්‍රිකානු ප්‍රදේශ පසු කොට යුරෝපයේ මුවවිට දක්වා පැමිණ තිබුණේ ය. ක්‍රි.ව. 711 දී තාරික් ප්‍රමුඛ ඉස්ලාමීය සේනා ජිබ්‍රෝල්ටා සමුද්‍රසන්ධිය පසු කරමින් ස්පාඤ්ඤය වෙත කඩාවැදුනු අතර දහසය වන සියවස දක්වා ම ඔවුන් විසින් ගොඩනගනු ලැබූ ඉස්ලාමීය රාජධානි එහි ක්‍රියාත්මක විය. මධ්‍යාසියානු කලාපයෙන් කොටසක් ද මේ වන විට ඉස්ලාමයේ ආධිපත්‍යයට නතුවෙමින් පැවති අතර යටත් වූ සියලු ප්‍රදේශ එක් පාලකයෙකු යටතේ අධිරාජ්‍යයක් ලෙස සංවිධානය වූයේ ය. අතිවිශාල භූමි කලාපයක විසිරී ගිය කාලිෆ් නමින් හැඳින් වූ මෙම ඉස්ලාමීය අධිරාජ්‍යය ලෝක වෙළෙඳාමේ ඉතා විශාල කොටසක උරුමක්කරුවා වූයේ ය. ඉතා විධිමත්ව සංවිධානය වූ අරාබිවරු නොබෝ කලකින් ම යුරෝපය හා චීනය යා කළ වෙළෙඳාමේ අතරමැදියෝ බවට පත් වූහ. ඉන්දියාව, ලංකාව, ශ්‍රී විජය, ජාවා ආදි රාජධානිවලට යාත්‍රා කළ ඔවුහු මුතු, මැණික්, ඇත් දළ, කපු පිළි, ඖෂධ, ශක්තිමත් දැව දඬු, කුළුබඩු, පිඟන් භාණ්ඩ හා සේද රෙදි ආදිය සඳහා වයින්, ඔලිව් තෙල්, බුමුතුරුණු, සුවඳ විලවුන් ආදි භාණ්ඩත් මස්ලින් සහ ගෝස් ආදි රෙදි පිළි වර්ගත් හුවමාරු කර ගත් හ. පෙරදිග භාණ්ඩ අපරදිගටත් අපරදිග භාණ්ඩ පෙරදිගටත් ගෙන ගිය අරාබි වෙළෙන්දෝ පෙර අපර දෙදිග යා කළ ප්‍රධානතම පිරිස බවට පත්වෙමින් සිටියහ.

### අරාබි වෙළෙන්දන්ගේ ක්‍රියාකාරීත්වය

ක්‍රිස්තු වර්ෂ අට වන සියවස වන විට ඉන්දියන් සාගර කලාපීය වෙළෙඳාමේ විශාලත ම කොටසක උරුමක්කරුවන් බවට පත් වූයේ අරාබි ජාතිකයින් ය. කාලිෆ් ඉස්ලාමීය අධිරාජ්‍යය පරිහානියට පත් වුව ද මුස්ලිම් වෙළෙන්දන්ගේ ක්‍රියාකාරීත්වය හා වෙළෙඳ ඒකාධිකාරය දහසය වන සියවසේ පෘතුගීසි බලය ඉන්දියන් සාගර කලාපයෙහි ව්‍යාප්ත වන තෙක් සිඳී නොගියේ ය. ක්‍රි.ව. අට වන හා නව වන සියවස් වන විට චීනයේ ටාං රාජ වංශිකයින් වර්ධනය වූ වෙළෙඳ ප්‍රවණතා හමුවේ පෙරට වඩා විවෘත භාවයකින් යුතු



චීනයේ කැන්ටන් වරාය: 18වන සියවස (උපුටා ගැනීම : https://coinindia.com/)

ව වෙළෙඳ කටයුතුවල නිරත වූයේ ය. චීනය දැක් වූ ලිහිල් ප්‍රතිපත්ති හමුවේ අරාබි වෙළෙන්දන් චීනය තම වෙළෙඳ ජාලයෙහි එක් අන්තයක් ලෙස සලකනු ලැබී ය. අරාබි වෙළෙන්දන් බහුලව චීනය වෙත යාත්‍රා කිරීම හේතුවෙන් අග්නිදිග ආසියාවේ වර්ධනය වෙමින් පැවති ශ්‍රී විජය හා ජාවා වැනි රාජධානි මහා ධනස්කන්ධයක් හිමි රාජධානි බවට පත් වූයේ ය. ශ්‍රී විජය හා ජාවා රාජධානි මේ වන විට චීනය දක්වා යන අරාබි ඇතුළු අනෙකුත් වෙළෙඳ ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලන පහසුකම් සපයන්නෙකුගේ භූමිකාව නිරූපනය කළ ආකාරය හඳුනාගත හැකි ය.

**කැන්ටන් සංහාරය එය ලෝක වෙළෙඳාම ඇති කළ බලපෑම**

ලංකාව ද මේ වන විට ප්‍රස්තුථ ප්‍රවාහයේ පහසුකම් සැපයීමේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙමින් පැවතිණි. එහෙත් චීනයෙහි ඇති වූ එක්තරා සිදුවීමක් මෙතෙක් පැවති වෙළෙඳ රටාව හා එක් එක් කලාප දිනා සිටි භූමිකා වෙනස් කිරීමට බලපෑවේ ය. 'කැන්ටන් සංහාරය' යනුවෙන් හඳුන්වනු ලබන මෙම සිද්ධිය ක්‍රි.ව. 878 දී සිදු වූවකි. වෙළෙඳාම කෙරෙහි දැඩි ලෙස විරෝධය පෑ කොන්ෆියුසියස්වාදී පූජකයින් ඇතුළු චීන ජන කණ්ඩායම් විදේශීය වෙළෙඳ කණ්ඩායම් නැවතී සිටි කැන්ටන් වරායබඳ කුඩාරම් ගිනිබත් කර දැමූ අතර එයින් දළ වශයෙන් 120,000කට ආසන්න පිරිසක් සමූල ඝාතනයට ලක් වූ බව සඳහන් වේ. මෙමගින් විශාලතම හානිය සිදු වූයේ අරාබි වෙළෙඳ ප්‍රජාවටයි. මෙම සිදුවීමෙන් පසු සියවස් ගණනාවක් යන තුරු චීනය වෙත ඍජු වෙළෙඳ ගමන්වල නිරතවීමට අරාබි ජාතික වෙළෙන්දෝ කැමැත්තක් නොදැක් වූහ.

**අරාබි වෙළෙඳුන්ගේ ආසියානු භූමිකාව**

මේ සමඟ ලංකාව, ශ්‍රී විජය, ජාවා වැනි රාජධානි චීන වෙළෙඳ භාණ්ඩ එක්රැස් කරනු ලැබූ ගබඩාවලින් පිරි රාජ්‍ය බවට පත් විය. මෙම රාජධානිවලට පැමිණි අරාබි වෙළෙන්දන් තම වෙළෙඳ භාණ්ඩවලට චීනයේ සිට ගෙන ආ වෙළෙඳ භාණ්ඩත් එක් එක් රාජධානිවල දී ලබා ගැනීමට හැකි වූ වෙළෙඳ භාණ්ඩත් ඔවුන් ගෙන ආ වෙළෙඳ භාණ්ඩ සමග හුවමාරු කර ගත්තේ ය. ලංකාවේ සිටි අරාබි ජාතිකයින් පිළිබඳ පැහැදිලි සාක්ෂි හමු වන්නේ ක්‍රි.ව. නව වන සියවසේ බැග්ඩෑඩ්හි විසූ අල් බලධූරී නමැති ලේඛකයාගේ සටහන්වලිනි. ලක්දිව ජීවත්ව සිට මිය ගිය මුස්ලිම් වෙළෙන්දන් කිහිප දෙනෙකුගේ වැන්දඹු භාර්යාවන් සහ දරුවන් ටයිග්‍රිස් ගංගාව අසබඩ පිහිටි ඔවුන්ගේ මව් භූමියට යැවූ බව හෙතෙම සඳහන් කරයි. අල් බලධූරී විසින් ම රචනා කරන්නට ඇතැයි ප්‍රවාදගත ව පවතින 'සින්බෑඩ්ගේ චාරිකා' නම් වූ කෘතිය මගින් ද පෙනී යනුයේ අරාබි වෙළෙන්දන් ක්‍රියාකාරී ලෙස සාගර වෙළෙඳාමේ නිම් වළලු පුළුල් කළ බවයි. මෙම කෘතිය ඔස්සේ නාවික රුචිකත්වය හා එමගින් ලැබිය හැකි කුතුහලය පිරුණු අත්දැකීම් පිළිබඳ අවබෝධයක් අරාබිවරුන් තුළ ජනිත කරවීම සිදු කළ බවට මතයකි. ලක්දිව සිට අරාබි අර්ධද්වීපයේ මදීනාව බලා ගිය දූතයෙකු පිළිබඳ ව 'ඉබ්න් ෂහාරියාර්ගේ අජායිබ් අල් හින්ද්' හෙවත් 'ඉන්දියාවේ ඓශ්චර්යය' නම් කෘතියෙහි වාර්තා කොට තිබේ. මේ වන විට අබූ බකර් මිය ගොස් සිටි බවත් උමර් නව කාලිෆ්වරයා ලෙස පත් ව සිටි බවත් දූත ගමන නිමා කිරීමෙන් පසු ආපසු එන ගමනේ දී මක්‍රාන් වෙරළේ දී දූතයා මිය ගිය බවත් ඔහුගේ ඉන්දියානු සහචරයා දූත ගමන පිළිබඳ විස්තර මෙරට රජුට දැන් වූ බවත් සඳහන් වේ.

ක්‍රිස්තු වර්ෂ 878 දී සිදු වූ කැන්ටන් සංහාරය අරාබි වෙළෙඳුන් කෙරෙහි කවර බලපෑමක් සිදු කළේ ද යන්න පැහැදිලි වනුයේ, ඉස්ටාක්‍රි, ඉබ්න්, හවුක්වාල් හා මක්දිසි ආදි අරාබි වාර්තාකරුවන් සඳහන් කරන විස්තර අනුවයි. ඔවුන්ගේ වාර්තා අනුව අරාබින්ගේ නැගෙනහිර මුහුදු මාර්ගයන්හි ගමනාන්තය ලංකාවයි. කුළුබඩු කෝමාරිකා ඇතුළු ඖෂධ මැණික් ආදිය මෙකල අරාබීන්ගේ සිත්ගත් වෙළෙඳ භාණ්ඩ බව ඉස්ටාක්‍රි සඳහන් කරයි. එමෙන් ම, 'දූෂාබ්' නම් වූ පැණි වර්ගයට අරාබි ලෝකයේ රජවරුන්ගෙන් හා ප්‍රභූන්ගෙන් ලැබුණු ඉහළ රුචිකත්වය පිළිබඳ ව ද හෙතෙම විස්තර සපයා තිබේ. ලොව පුරා ප්‍රචලිත වූ මෙරට කුරුඳු පිළිබඳ පළමු සටහන ද අරාබි ලේඛකයෙකුගේ වාර්තාහි අන්තර්ගත ය. ඒ 'බුසර්ග් බි ෂාහිරියර්' නම් කතුවරයා විසින් රචිත වාර්තාවේ ය. හෙතෙම, කිතු වසින් දහවන සියවසේ විසූවෙකි. අරාබි වෙළෙඳුන් විසින් සිය ගමනාන්තය ඉන්දියාව හා ලංකාව වැනි රටවල්වලට සීමා කිරීමේ ආර්ථික ප්‍රතිලාභ ඉතා ඉක්මණින් ලංකාවට දැනී තිබුණු බව පෙනෙනුයේ, අල් ඉද්‍රිසි විසින් සපයනු ලබන වාර්තාවෙනි. ඔහුගේ වාර්තාවල මැණික් හා ඇතැම් සුවඳ විලවුන් වර්ග ලක්දිව නිපදවන බව ද දහසය දෙනෙකුගේ කවුන්සලයක් විසින් මෙරට වෙළෙඳාම හැසිරවීම උදෙසා රජුට සහය වූ බව ද සඳහන් ව තිබේ. මෙලෙස පත් වූ දහසය දෙනොගේ කවුන්සලය වෙත බෞද්ධයින් හතර දෙනෙකු කිතුනුවන් හතර දෙනෙකු යුදෙව්වන් හතර

දෙනෙකු හා ඉස්ලාමිකයින් හතර දෙනෙකු අන්තර්ගත වූ බව කියැ වේ. මෙවැනි කවුන්සලයක අවශ්‍යතාව වෙළෙඳ වාණිජ ක්‍රියාකාරීත්වයෙහි තීව්‍රතාව හේතුවෙන් පැන නැගෙන්නට ඇති බව නිසැක ය.

### මුස්ලිම් වෙළෙඳුන් ලෙස සංවිධානය වීම

අබ්බසිද් පරම්පරාවේ අභාවයත් සමග මැදපෙරදිග කේන්ද්‍ර කර ගෙන තිබූ කාලිෆ් අධිරාජ්‍යය බිඳී විසිරී ගියේ ය. එහෙත් 'මුස්ලිම් වෙළෙන්දන්' යන පොදු නාමයෙන් තවදුරටත් ඔවුහු සිය වෙළෙඳ වාණිජ කටයුතුවල නිරත වූවෝ ය. මේ වන විට ස්පාඤ්ඤය, ඊජිප්තුව, යේමනය ආදී ප්‍රදේශ මුල් කර ගනිමින් බිහි වූ සුල්තාන් රාජ්‍ය, තවදුරටත් අරාබිවරුන් ගෙන ගිය වෙළෙඳාම මේ කොටස්කරුවන් ලෙස කටයුතු කළ ආකාරය හඳුනාගත හැකි ය. මේ පිළිබඳ කෙරෙන කදිම සටහනක් යාපහුවේ බලයට පත් පළමු වන බුවනෙකබාහු (ක්‍රි.ව. 1272 -1283) රාජ්‍ය සමයේ දී ඊජිප්තුවට යැවූ දූත මෙහෙවරක් ආශ්‍රයෙන් ප්‍රකට වෙයි. මෙහි දී රජු යැවූ සන්දේශයෙහි මෙරටින් ඊජිප්තු සුල්තාන්වරයාට ලබා ගත හැකි වාසි පහත පරිදි දක්වා තිබේ.

> **"ඔබ වෙත ලැබෙන මුතුවල පූර්ණ අයිතිය ඇත්තේ මෙරට රජු වන මා හටයි. මුතු පමණක් නොව වටිනා මැණික් වර්ග ද අප ට සැපයිය හැකියි. වසරකට යාත්‍රා 20ක් සැපයීමේ හැකියාව අප රට සතු වන බව සතුටින් දන්වා සිටීමට කැමැත්තෙමි. ඔබගේ යටත් වැසියන් හට මෙරට වෙළෙඳාම උදෙසා වන නිදහස ලබාදීමට අප කැමැත්තෙන් සිටිමු. ඔබට ඇති ලෙන්ගතුකම හේතුවෙන් යේමනයේ කුමාරයා විසින් මෙරටට එවූ තානාපතියා මා හරවා යැවීමට කටයුතු කර තිබේ. හෙල්ල හැනීමට හැකි ශක්තිමත් දැව, අලි ඇතුන් මෙන්ම සිනින් කපු පිළි ද මා සතුව තිබෙයි"**

මේ අනුව මෙකල ඇතිවෙමින් පැවති නව වෙළෙඳ ප්‍රවණතා මෙරට පාලකයන් විසින් කොතරම් සාර්ථක ව කළමනාකරණ කළේ ද යන්න පැහැදිලි වේ.

ක්‍රිස්තු වර්ෂ දාහතර වන සියවසේ ලක්දිවට පැමිණි ඉබ්න් බතුතා නම් වාර්තාකරුවා ලක්දිව පිළිබඳ සටහන් කර ඇති විස්තරය ඉතා වැදගත් එකකි. හෙතෙම, ලක්දිවට පැමිණෙන කාල පරිච්ඡේදය වන විට මෙරට දකුණේ පාලකයින් හා උතුරේ ආර්ය චක්‍රවර්තී පාලකයින් අතර වෙළෙඳ වාණිජ වශයෙන් මෙන් ම දේශපාලනික වශයෙන් ද ප්‍රබල තරගයක් පැවතියේ ය. යාපනයේ පාලකයාගේ සහයෙන් ශ්‍රී පාද වන්දනාවේ ගිය හෙතෙම කොළඹ අවට මුහුදු කලාපයෙහි සිදු වූ මංකොල්ලකෑම් පිළිබඳවත් මෙරට නිපද වූ මැණික් පිළිබඳවත් විස්තරයක් සපයා දේ. 'අබු අබ්දුල්ලාහ් ඉබ්න් අල් කාෆි' නමැත්තෙකු ශ්‍රී පාද වන්දනාවේ ගිය පළමු මුස්ලිම් වන්දනාකරුවා බවත් ඔහු ලක්දිවෙන් ලද විශාල පරිමාණයේ මැණික් ගල් දෙකක් එරට රජුට තෑගි කළ බවත් බතුතා සිය වාර්තාවේ අතුරු තොරතුරු ලෙස දක්වා තිබේ. මීට අමතර ව දෙවිනුවර හා ගාල්ල යන වරායන්හි සිටි මුස්ලිම් වෙළෙඳුන් පිළිබඳ ව ද එහි විස්තර වෙයි. කොළඹ වරාය 'ජලස්ති' නම් වූ පුද්ගයෙකු විසින් පාලනය කළ බවත් ඇබිසීනියානුවන් සියයක් පමණ ඔහු යටතේ වරායේ සේවය කළ බවත් හෙතෙම වැඩි දුරටත් විස්තර කර තිබේ. මෙම වාර්තා සියල්ල මගින් පෙනී යනුයේ ඉස්ලාමය අරාබි ලෝකය වෙත හඳුන්වා දීමත් සමග ඉන් ලද නව ජීවයෙන් ප්‍රබෝධයට පත් වූ අරාබි වැසියා වෙළෙඳාමේ වැඩි වාසි අත් කර ගනිමින් දාහතර වන සියවස් වන විට අරාබි මුහුද පමණක් නොව සමස්ත ඉන්දියන් සාගර කලාපය පුරා සිය අණසක පතුරුවා හැර තිබූ බවයි.

### මධ්‍යකාලීන ආසියානු රාජධානිවල නැගීම

ක්‍රිස්තු වර්ෂ දහ වන හා එකොළොස් වන සියවස් වන විට ලෝක වෙළෙඳ ප්‍රවණතාවන්හි තවත් වෙනස්කම් කිහිපයක් ඉස්මතු වූයේ ය. වයඹ හා බටහිර කපොලු ඔස්සේ ඉන්දියාවට ඇතුළු වූ ඉස්ලාමීය බලය, දකුණු ඉන්දියාවේ තන්ජෝරය පදනම් කර ගත් චෝළ ආධිපත්‍ය ඉදිරියට පැමිණීම, අග්නිදිග ආසියානු කලාපය පදනම් කර ගනිමින් වර්ධනය වූ බුරුමය, කාම්බෝජය වැනි රාජධානි මෙන් ම ශ්‍රී විජය හා ජාවා යන රාජධානිවල වෙළෙඳ ක්‍රියාකාරීත්වය ද මෙම වෙනස්කම් කෙරෙහි බෙහෙවින් ඉවහල් විය. එබැවින් බෙංගාල බොක්ක ආශ්‍රිත සාගරය ඉතා තරගකාරී වෙළෙඳ ක්‍රියාකාරීත්වයකින් හෙබි නාවික තටාකයක් බවට පත් වූ ආකාරය හඳුනා ගත හැකි ය. මෙය වසර 1500ක් පුරා මෙරට අගනගරය වූ අනුරාධපුරය පොළොන්නරුව දක්වා මාරුවීමට පවා ප්‍රබල බලපෑමක් එල්ල කළ බවට මත පළ වී තිබේ. ගෝකණ්ණතිත්ථ, කොට්ටියාරම ආදි නැගෙනහිර වෙරළබඩ තොටුපොළ මෙකල වඩාත් වැදගත් වූ අතර එහි පාලනය පහසුවෙන් ගෙනයාමේ හැකියාව මහවැලි නදිය අසබඩ පිහිටි පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම කෙරෙහි හේතු වූ බව උපකල්පනය කළ හැකි ය. පළමුව මෙකී වැදගත්කම හඳුනා ගනු ලැබුවේ චෝළයින් විසිනි. පළමුවන විජයබාහු (ක්‍රි.ව.1055-1110),

පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1153-1186) යන රාජ්‍ය අවධිවල දී බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු කලාපයේ වෙළෙඳ ඒකාධිකාරය සඳහා ඇතිවෙමින් පැවති තරගයෙන් ලංකාවට ද විශාල වාසියක් හිමි කළේ ය.

මේ වන විට චීනයෙහි වර්ධනය වෙමින් පැවති ආර්ථික ප්‍රවණතා ද වෙළෙඳාම විෂයෙහි බෙහෙවින් බලපෑවේ ය. උතුරු සුං හා දකුණු සුං ලෙස ක්‍රියාත්මක වූ රාජ වංශ දෙක අතුරින් දකුණු සුං යනු නාවික කටයුතු කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක් වූ පෙළපතකි. සාගරික ගවේෂණ කෙරෙහි අවධානය යොමු කළ ඔවුහු අග්නිදිග ආසියානු කලාපය හා ඉන්දියන් සාගර කලාපය දක්වා වූ විශාල සමුද්‍ර වපසරියක සිය නාවික බලය මෙහෙය වූහ. සුං රාජවංශය වෙළෙඳාම කෙරෙහි දැක් වූ ලිහිල් ආකල්පය ද සමකාලීන වශයෙන් නැවත චීනය දෙසට වෙළෙඳ ප්‍රජාවගේ අවධානය යොමුවීම කෙරෙහි ඉවහල් වූ බව නිසැක ය. මේ සියලු වෙළෙඳ ප්‍රවණතා ලංකාවේ වෙළෙඳ වාණිජ ක්‍රියාවලිය කෙරෙහි ඇති කළේ සාධනීය බලපෑමකි. අතරමැදියෙකුගේ තත්ත්වයෙන් හා ඇතැම් වෙළෙඳ භාණ්ඩ ප්‍රතිඅපනයනයෙන් මේ වන විට ලංකාව ලබා සිටි ප්‍රගතිය ඉතා ඉහළ මට්ටමක පැවතියේ ය. මූලාශ්‍රය අනුව, පළමුවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153 - 1186) බුරුම ආක්‍රමය සඳහා ද පොළඹවනු ලැබූයේ අලි ඇතුන් සඳහා ශ්‍රී ලංකාව දරමින් සිටි ඒකාධිකාරය හා ප්‍රතිඅපනයන කටයුතු බුරුමය විසින් උදුරා ගැනීමට දැරූ ප්‍රයත්නය හේතුවෙන් බව පෙනේ. මෙය වඩාත් පැහැදිලි වනුයේ පරාක්‍රමබාහු රජු විසින් නිකුත් කොට ඇති නයිනතිව් දෙමළ ශිලා ලේඛනයෙනි. එහි ඌරාතොට වරාය අවට නෞකාවක් අනතුරට ලක් වුවහොත් ඉන් භාණ්ඩාගාරයට ලැබිය යුතු කොටස් කවරේ ද යන්න විස්තර කර තිබීම නිසා ය.

**මොංගෝලීයානුවන්ගේ මැදිහත්වීම**

කිස්තු වර්ෂ දහතුන් වන සියවස ආසියාකරයේ බොහෝ ප්‍රදේශවල දේශපාලන ආධිපත්‍යය මොංගෝලියානුවන් අතට පත් වූ කාල පරිච්ඡේදය වශයෙන් සැලකේ. චීනයට උතුරින් පිහිටි බිම් පෙදෙස් මොංගෝලියානුවන්ගේ නිජබිම් වූයේ ය. දිගු කලක් එඬේරුන් ලෙස තම ජීවිකාව ගෙන ගිය මොවුහු, අසුන් පිට නැගී තැනිබිම්හි ඔබ මොබ සැරිසැරූහ. රණශූරත්වය උපතින් ම උරුම කර ගත් මොවුන් වරින් වර යුරෝපය දෙසටත් මධ්‍යාසියානු ප්‍රදේශ දෙසටත් චීනයටත් කඩාවැදුනි. එබැවින් මොංගෝලියානුවන් නැගෙනහිර ආසියාකරයේ සිට යුරෝපය දක්වා ම විහිදී ගියේ ය. සතුන් ගෘහස්තීකරණය කිරීමට මෙන් ම අශ්වයින් අල්ලා හීලෑ කිරීමේ හැකියාව ද මොංගෝලියානුවන් සතු වූයේ ය. එබැවින් කාලාන්තරයක සිට ආසියානු හා යුරෝපීය රාජ්‍ය වෙත හීලෑ අශ්වයින් සැපයීමේ කොටස්කරුවෙකු බවට මොංගෝලියානුවන් පත්ව සිටි ආකාරය හඳුනාගත හැකි ය. වසර සිය ගණනක සිට එඬේර ජීවිතයට අමතර ව වෙළෙඳාමේ පාර්ශ්වකරුවන් ලෙස බැඳී සිටි මොංගෝලියානුවන් අධිරාජ්‍ය සංකල්පය වෙත පිය මනිනු ලැබූයේ ජෙන්ගිස් ඛාන් (ක්‍රි.ව. 1206 - 1227) හා කුබ්ලයි ඛාන් (1260 - 1294) යන පිය පුතු දෙපළගේ දැඩි උත්සාහය හේතුවෙනි. මොවුන් විසින් මෙහෙයවනු ලැබූ ආක්‍රමණ යුරෝපය දක්වාත් මධ්‍යාසියානු ප්‍රදේශ හා ඉන්දියානු ප්‍රදේශ දක්වාත් චීන හා අග්නිදිග ආසියානු ප්‍රදේශ දක්වාත් විහිදී ගියේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ, එතෙක් ලොව ගොඩනැගී තිබූ දැවැන්ත ම අධිරාජ්‍යයේ අයිතිකරුවන් බවට මොංගෝලියානුවන් පත්වීමයි. යු-ආන් නමින් චීන වැසියා හඳුන්වනු ලැබූ මෙම රාජ වංශ අවධියෙහි වෙළෙඳාමෙහි විශාල දියුණුවක් ඇති විය. දකුණු සුං රාජ වංශය විසින් ක්‍රියාත්මක කරමින් තිබූ සාගරික ගවේෂණ හා දූත කණ්ඩායම් පිටත් කර හැරීම් යු-ආන් රාජ වංශය විසින් ඊටත් වඩා විධිමත් ව හා ක්‍රියාශීලී ව ඉදිරියට ගෙන ගියේ ය. මොංගෝලියානු සම්භවයක් පැවැති චීන අධිරජුන් වූ මොවුහු ලොවෙහි දැවැන්ත ම අධිරාජ්‍යයට මේ වන විට උරුමකම් කීවෝ ය. ඔවුන් සේද මාවත හරහා යුරෝපය සමග



මොංගෝලීයානු අධිපත්‍යය යටතේ සාමය හා විනය ප්‍රතිස්ථාපනය කිරීම සන්කේතවත් කරණුවස් වැනීසියේ මාර්කෝ පෝලෝ නැගෙනහිරට ගමන් කරන ආකාරය, සුප්‍රකට කැටලාන් සිතියමෙහි සිතුවම් කර ඇති අයුරු (උපුටා ගැනීම: https://en.wikipedia.org)

සෘජු වෙළෙඳ සබඳතා තහවුරු කරනු ලබන්නේ සිය අධිරාජ්‍ය තුළ සාමය හා විනය ස්ථාපනය කරමිණි. අවස්ථා දෙකක දී යු-ආන් රාජ සභාවෙන් ලක්දිවට දූතයින් එවනු ලැබූ බව කියැ වේ. මොවුන්ගේ අරමුණ වූ බව පෙනෙනුයේ, සාගරය ඔස්සේ සිදු වූ සාරවත් වෙළෙඳාමෙහි ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස කටයුතු කළ ලංකාව සමග මිත්‍ර සබඳතා ගොඩනඟා ගනිමින් හවුල්කරුවෙකු බවටත් පත් කර ගැනීමයි.

### චීන මිං රාජ වංශිකයින්ගේ සාගර ගවේෂණ

යු-ආන් රාජ වංශයෙන් පසු චීනයේ බලය ලබා ගත් මිං රාජ වංශිකයින් ද වෙළෙඳාම කෙරෙහි දැඩි සැලකිල්ලක් දැක් වූ පෙළපතකි. මේ වන විට සෘජු වෙළෙඳාම මගින් චීනය අත් කර ගෙන සිටි වාසි තවදුරටත් දියුණු කර ගැනීමට කටයුතු කළ මිං පෙළපත සාගර ගවේෂණ කෙරෙහි පුළුල් අවධානයක් යොමු කරනු ලැබී ය. ඒ අනුව, දකුණු චීන මුහුද අභිබවා යාත්‍රා කළ දැවැන්ත චීන නෞකා මේ වන විට අප්‍රිකාවේ නැගෙනහිර වෙරළ දක්වා ම ළඟා කරවීමට සමත්වී ය. සාගර ගවේෂණයක නිරත වූවන් අතර යොංගල් අධිරාජ්‍යයාගේ (ක්‍රි.ව. 1402 - 1424) චෙන්-හ නැමති සෙන්පතියා මෙහි නායකත්වය හෙබවූ අතර, ඔහු ප්‍රමුඛ චීන නාවික කණ්ඩායමක් මෙරටට ද පැමිණි බවට මූලාශ්‍රය හමුව ඇත. ක්‍රි.ව.1405 දී ප්‍රථම වරට මෙරටට ගොඩබැසි චෙන් හ ප්‍රමුඛ නාවික කණ්ඩායම, නැවත ක්‍රි.ව.1409 දී මෙරටට ගොඩබැස ඇත්තේ මෙරට රජු ඇතුළු ජන ප්‍රධානීන්ට මෙනේ ම, ප්‍රකට පූජ්‍යස්ථාන කිහිපයකට ද තුටු පඬුරු රැගෙන ය. එහෙත් මෙම අවස්ථාවේ දී රයිගම සිට පාලනය මෙහෙය වූ වීර අලකේශ්වර විසින් එල්ල කළ විරෝධතා හමුවේ චෙන් හ එම තුටු පඬුරු දෙවිනුවර දේවාලයට පුදා ආපසු ගිය බව කියැවේ. ඔහු විසින් දෙවිනුවර ආසන්නයේ ස්ථාපිත කරන්නට ඇතැයි විශ්වාස කෙරෙන ගාල්ල ත්‍රිභාෂා ශිලා ලේඛනය යනුවෙන් වර්තමානයේ ප්‍රකට අභිලේඛනය, මෙම පැමිණීම තහවුරු කරයි. වීර අලකේශ්වරගේ විරෝධතාවයෙන් පසු චෙන්-හ 50000ක ආධාරක හමුදාවක් ද රැගෙන මෙරටට පැමිණ අලකේශ්වර ඇතුළු පිරිසක් චීනයට ගෙනගිය බව කියැවේ. මෙලෙස ගෙන ගිය ලාංකේය සිරකරුවන් පිරිස වෙත චීන අධිරජු සමාව ලබා දුන් බවත් අධිරජු වෙනුවෙන් මෙරට පාලනය කිරීම සඳහා 'යෙහිපා නයිනා' නමැත්තෙකු පත් කළ බවත් චීන වාර්තාවල සඳහන් වේ.

### සෘජු වාණිජ සබඳතා හා මුස්ලිම් වෙළෙඳ ඒකාධිකාරය

චීන ජාතිකයන් බටහිර දෙසට සංක්‍රමණය වීම ලෝක වෙළෙඳ ප්‍රවාහයේ නව ප්‍රවණතා කිහිපයක් ඇතිවීම විෂයෙහි බලපෑම් ඇති කළේ ය. චීනය හා අපරදිග අතර පැවති වෙළෙඳාමේ අතරමැදියන් ලෙස කටයුතු කළ ශ්‍රී විජය හා ජාවා වැනි රාජධානිවල ඓතිහාසික භූමිකාව අභාවයට ගියේ මෙකී කල පරිච්ඡේදයේ දී ය. ඒ අනුව ලක්දිව නැගෙනහිර වෙරළේ පැවති සෞභාග්‍යමත් වෙළෙඳ රටාව ක්‍රමයෙන් බටහිර වෙරළ දෙසට සංක්‍රමණය වූයේ ය. රජරට පැවති රාජධානි නිරිතදිගට



චීන මිං රාජ වංශිකයින්ගේ සාගර ගවේෂණ (උපුටා ගැනීම : https://archive.roar.media )

විතැන්වීම කෙරෙහි කාලීන වශයෙන් වර්ධනය වූ මෙකී වෙළෙඳ වාණිජ රටාව මුල් වූ බව උපකල්පනය කළ හැකි ය. කාලිඟ් අධිරාජ්‍යය මේ වන විට පරිහානියට පත් ව ප්‍රාදේශීය සුල්තාන් රාජධානි කිහිපයක් අරාබි ලෝකයෙහි ඉස්මතුවෙමින් පැවතිණි. ඒවානම්, කයිරෝව පදනම් කර ගත් මිසරය, බැග්ඩෑඩ් පදනම් කර ගත් ඉරාක ප්‍රදේශ මෙන් ම ඇරගන්, නවාරේ හා ග්‍රෙනඩා ප්‍රදේශ පදනම් කර ගත් ස්පාඤ්ඤ රාජධානි වශයෙනි. එහෙත් මේ වන විට ඉන්දියාව ඇසුරු කර ගනිමින් ගොඩනැගී තිබූ දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය ඉස්ලාම් වෙළෙඳුන්ගේ ක්‍රියාකාරිත්වය තිව්‍ර කිරිමට බලපෑවේ ය. මුස්ලිම්වරු යන පොදු සම්මතයේ සිට වෙළෙඳාම් කළ බැවින් ඉන්දියන් සාගර කලාපයෙහි අත් කර ගෙන පැවති වෙළෙඳ ඒකාධිකාරය තවදුරටත් ආරක්ෂා කර ගැනීමේ හැකියාව තවත් සියවස් තුනක් පමණ යන තෙක් ඔවුන් සතු වූයේ ය. මෙලෙස ක්‍රියාකාරී වූ මුස්ලිම් වෙළෙඳුන්ගෙන් ඇතැම් පිරිස් මෙරට පුත්තලමේ සිට හම්බන්තොට දක්වා වූ වයඹ, බටහිර හා දකුණු මුහුදු ප්‍රදේශ ආශ්‍රිත තොටුපොළ වෙත ගොඩබැස්සූහ. ඔවුන් ප්‍රිය කළ වෙළෙඳ භාණ්ඩ බොහෝමයක් ගොඩබට තොටුපොළ ආශ්‍රිත අභ්‍යන්තර ප්‍රදේශවල පැවතියේ ය. මේ වන විට කුළුබඩු, මුතු, මැණික්, අත් දළ හා ඇතුන් සඳහා වූයේ ඉතා ඉහළ ඉල්ලුමකි.

**ස්වාධීන රාජ්‍ය හා දකුණු ඉන්දීය ක්‍රියාකාරීත්වය**

දෙවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ වර්ධනය, මලබාරය පදනම් කර ගනිමින් වර්ධනය වූ සශ්‍රීක වෙළෙඳ පොළ හා මුස්ලිම් වෙළෙඳුන්ගේ ක්‍රියාශීලී දායකත්වය ක්‍රි.ව. දාහතර වන හා පහළොස් වන සියවස්හි වෙළෙඳ වාණිජ සබඳතා කෙරෙහි ප්‍රබලව බලපෑම් ඇති කළේ ය. යාපන අර්ධද්වීපය පදනම් කොට ගෙන මෙරට ස්වාධීන රාජධානියක් ඉස්මතුවීම කෙරෙහි ද සමකාලීන වෙළෙඳ වාණිජ ක්‍රියාකාරීත්වය බෙහෙවින් ඉවහල් වන්නට ඇති බව සහේතුක ව උපකල්පනය කළ හැකි ය. මාර්කෝ පොලෝ හා ඉබ්න් බතූතා ආදි වාර්තාකරුවන් යාපන පාලකයා සතු වූ නාවික ශක්තිය පිළිබඳව වරින් වර වාර්තා කර ඇත. බතූතා ශ්‍රී පාද වන්දනය සඳහා යාපන පාලකයා විසින් සැපයූ මග පෙන්වන්නෙකුගේ උපකාර ලබා ගත් බව දක්වයි. මලබාර් වෙරළ කලාපයෙහි සශ්‍රීක වෙළෙඳ රටාව හා මුස්ලිම් වෙළෙඳුන්ගේ ක්‍රියාකාරීත්වය යාපන රාජධානිය කෙරෙහි හිතකර ආර්ථික පසුබිමක් නිර්මාණය කළ ආකාරය හඳුනාගත හැකි ය. එපමණක් නොව කර්ණාටක ප්‍රදේශ පදනම් කර ගනිමින් බිහි වූ විජයනගර් නම් වූ හින්දු අධිරාජ්‍යය වෙළෙඳ ක්‍රියාකාරීත්වය ඉහළට එසවීම කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළේ ය. ඉන්දියානු හින්දු ජනයාගේ ආරක්ෂකයා ලෙස ක්‍රියා කළ විජයනගර් අධිරාජ්‍යය, අරාබි මුහුදේ වෙළෙඳ කටයුතුවල ප්‍රතිලාභ තම රාජ්‍ය ආදායමේ විශාලත ම කොටස ලෙස යොදා ගත්තේ ය. කෝට්ටේ හය වන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1412-1467) කර්ණාට සේනා සමඟ වෙළෙඳ ආධිපත්‍යය දිනා ගැනීම සඳහා අරගලයක නිරත වූ බව, සමකාලීන මූලාශ්‍රය සනාථ කරයි. රජු විසින් ‘ආධිවාරම’ නැතහොත් ‘අධිවීර රාම’ නමැති තොටුපොළ ආක්‍රමණය කළ බව ‘ගිරා සන්දේශයේ’ විස්තර වන අතර, මීට හේතු වී ඇත්තේ භාණ්ඩ පුරාවා ගත් ලාංකේය නෞකාවක් කණ්ණඩ රජු විසින් මංකොල්ලකෑමයි. ‘කණ්ණඩ’ යනු විජයනගර්වරු හැඳින්වීම සඳහා දේශිය වශයෙන් භාවිත නාමයකි. මෙම කාල වකවානුව වන විට තුර්කිවරුන් ඉස්ලාමය වැළඳ ගෙන රණකාමී පිරිසක් ලෙස ඉදිරියට පැමිණියේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ පැරණි කාලිඟ් අධිරාජ්‍යය සතු වූ භූමි ප්‍රදේශවලින් වැඩි කොටසක ආධිපත්‍යය ඔවුන් සතු වීමයි. මේ වන විට මැද පෙරදිග සිට විහිදී ගිය වෙළෙඳ ජාලයේ ඒකාධිකාරය තුර්කිවරුන්ට හිමි වූ අතර එහෙයින් යුරෝපය දක්වා ගෙන ගිය පෙරදිග වෙළෙඳ භාණ්ඩවලින් වැඩි ලාභයක් ඔවුන්ට හිමි වූ ආකාරය හඳුනා ගත හැකි ය.

මේවන විට යුරෝපයෙහි ගොඩනැගෙමින් පැවති සමාජායතනික ප්‍රවණතා ක්‍රි.ව. පහළොස් වන හා දහසය වන සියවස්හි ලෝක වෙළෙඳ ප්‍රවාහයේ තීරණාත්මක වෙනස්කම් රැසක් නිර්මාණයවීම කෙරෙහි මුල් වූයේ ය. පෘතුගීසී හා ස්පාඤ්ඤ යන යුරෝපා ජාතීන් සෘජු ව පෙරදිග වෙත සේන්දුවීම සඳහා සිදු කළ දිගු කාලීන සාගර ගවේෂණවල අවසාන අදියරට ඔවුන් මේ වන විට ළඟා වෙමින් තිබුණේ ය. පැරණි වෙළෙඳ මාර්ග වෙනුවට සාගර තරණයෙන් පෙරදිගට ළඟා විය හැකි වෙළෙඳ මාර්ගයක් විවෘත කර ගැනීමට ඔවුහු නිරන්තරයෙන් උත්සුක වූහ. දිගුකාලීන ව යුරෝපීයයන් මැවූ සිහිනය ක්‍රි.ව. 1498 දී වස්කෝ ද ගාමා ප්‍රමුඛ පෘතුගීසි නැවියන් විසින් සඵල කර ගැනීමට සමත් වූ අතර ඔවුන් ඉන්දියාවේ කැලිකට් වරාය වෙත ළඟා වූයේ සියවස් අටක පමණ කාලයක සිට ඉන්දියන් සාගර කලාපයෙහි පැවති මුස්ලිම්වරුන්ගේ වෙළෙඳ ඒකාධිකාරය බිඳ දමමිණි. මෙකී සංසිද්ධිය අනාගත ලෝක වෙළෙඳ-වාණිජ ප්‍රවණතා කෙරෙහි කල්පවත්වන අන්දමේ තීරණාත්මක බලපෑම් ඇති කළ හැරවුම් ලක්ෂ්‍යය ලෙස සැලකිය හැකි ය.

## සමාලෝචනය

යටත් පිරිසෙයින් ඉපැරණි ශිෂ්ටාචාර අවධියේ සිට ක්‍රි.ව. පහළොස් වන සියවස දක්වා කාල අවකාශයට අදාළව ලෝක වෙළෙඳ ප්‍රවණතා විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන කරුණක් නම්, අතීත ලෝකයට අදාළ ව පෙර අපර දෙදිග කලාපය තුළ විසිර පැවති රාජ්‍ය, අධිරාජ්‍ය හා විවිධ ජාතීන් මෙන් ම සංස්කෘතික කණ්ඩායම් වශයෙන් ද එකම දම්වැලක පුරුක් මෙන් සමකාලීන වෙළෙඳ ප්‍රවාහය හා සම්බන්ධව සිටි බවයි. එහි අඩු වැඩි වශයෙන් තම භූමිකාව තීරණය වීම කෙරෙහි ඔවුනොවුන් සතුවූ භූ දේශපාලනික පිහිටීම, ස්වභාවික සම්පත්, නිෂ්පාදන, ශිල්ප ප්‍රාගුණ්‍යය, තාක්ෂණය මෙන් ම, සමාජායතනික හැකියාව ආදි කරුණු තීරණාත්මක බලපෑමක් ඇති කළ බව හඳුනාගත හැකි ය. සැම විට ම බලසම්පන්න රාජ්‍යය මෙකී වෙළෙඳ ප්‍රවාහය හැසිරවීම සඳහා කටයුතු කළේ ය. ප්‍රස්තුත ලෝක වෙළෙඳ ප්‍රවාහය සෙසු රාජ්‍යවල මෙන් ම ශ්‍රී ලංකාවේ වෙළෙඳ-වාණිජ ක්‍රියාවලිය හා ඉන් ඔබ්බෙහි මෙරට සමාජායතනික දේහයට ද තීරණාත්මක බලපෑමක් ඇති කරවූ බව, ඉහත සැකැවින් දැක්වූ කරුණු ඔස්සේ වුව ද අවබෝධ කොට ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


***Sri Lanka and the Silk Road of the Sea.*** 2003, Ed. Senaka Bandaranayake, Lona Dewaraja, Roland Silva, K. D. G. Wimalaratne, Colombo: Sri Lanka Institute of International Relations, Central Cultural Fund. Sri Lanka National Commission for UNESCO.

Hahas, Hasudul 1994. ***History of Islam***, (Classical Period 571-1258 CE), Vol. I, Lahore: Islamic Publicatins (pvt) Ltd.

Hitti, Philip K. 2001. ***History of the Arabs***, London: Macmillan Press Ltd.

Dewaraja, Lorna 1994. ***The Muslims of Sri Lanka***, (One thousand years of Ethnic Harmony. 900 - 1915), Colombo: The Lanka Islamic Foundation.

Dawei, Cao, Sun Yanjing, 2010. ***China's History***, China International Press.

ශාන්ත, අරුණ. 2019, **ශ්‍රී ලංකාවේ වෙළෙඳ වාණිජ ඉතිහාසය පිළිබඳ රචනා**, කොළඹ: ලංකා බැංකුවේ මුදල් හා බැංකු කෞතුකාගාරය. (වත්මන් කතුවරයාටම කතෘත්වය ඇති මෙම කෘතියේ එන එක් රචනයක් මෙම ලිපිය සඳහා නව සංස්කරණයෙන් යුක්තව පාදක කොට ගෙන ඇත)



# මූල්‍ය අර්බුදය තුළ රාජ්‍ය මුදල් කළමනාකරණයේ කාර්යභාරය

**එම් කේ ටී එන් හංසි**
**ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව**

## 1. රාජ්‍ය මුදල් කළමනාකරණයේ කාර්යභාරය

ගෙවීම් නියමිත පරිදි සිදු කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් රජය සතුව ඇති බව සහතික කිරීම මගින් අයවැය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම මුදල් කළමනාකරණයේ මූලික අරමුණයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ (Government Cash Management) මූලික කාර්යභාරය වන්නේ රජයේ අයවැය මූල්‍ය අර්බුදයක් පවතින කාලවකවානුවේ දී පවා සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වීමයි. නිසි මූල්‍ය කළමනාකරණයක් මගින් රාජ්‍ය ණය කළමනාකරණය, මුදල් ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වීම සහ මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය ද සාක්ෂාත් කර ගත හැකිය. (Williams, 2009).

නිසි රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් නොමැති අවස්ථාවල දී, අරමුදල් නොමැතිකම නිසා අයවැය ක්‍රියාත්මක කිරීමේ අපහසුතා මතුවීම, අතිරික්ත ද්‍රවශීලතාව නිසා නිෂ්ක්‍රීය ශේෂයන් භාණ්ඩාගාර නොවන ඒකකවල එකතු වීමෙන් අනවශ්‍ය වියදම් සිදුවීමේ ප්‍රවණතා වැඩි වීම ද සිදු වේ.

මුදල් කළමනාකරණය කිරීම සඳහා විවිධ ක්‍රමවේද භාවිත කරනු ලබයි. ඇතැම් වියදම්වල භාරය අවම කිරීම සඳහා වසර පුරාම කොටස් වශයෙන් ගෙවීම් කටයුතු සිදු කිරීම (උදා. මාරු කිරීම් සහ ප්‍රාග්ධන ආයෝජන), සුමට ව බදු එකතු කිරීමේ ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම (එකතු කළ අගය මත බද්ද, ආදායම් බද්ද, රේගු බදු), රාජ්‍ය ණය ගෙවීම් වසර පුරා ව්‍යාප්ත ව යන ආකාරයට කළමනාකරණය කිරීම, මනා මුදල් සංචිත කළමනාකරණය, කෙටි කාලීන ණය ගැනීම් සහ ආයෝජන සඳහා මූල්‍ය උපකරණ භාවිත කිරීම යනා දී ක්‍රමවේද ද ඒ අතර වේ. තවද, භාණ්ඩාගාරය සතු බැංකු ගිණුම් වල නිෂ්ක්‍රීය ශේෂ පරිමාව අවම කිරීම, අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ අධීක්ෂණය සහ පාලනය මෙන් ම, මූල්‍ය සහ මූල්‍ය සැලසුම්කරණය පහසු කිරීම සඳහා ලෝකයේ බොහෝ රටවල්, සියලු ම රජයේ මුදල් ගිණුම් වල ශේෂ ඒකාබද්ධ කරමින් තනි භාණ්ඩාගාර ගිණුමක් (Treasury Single Account (TSA)) මහා බැංකුවේ පවත්වාගෙන යයි. ශක්තිමත් ආයතනික විධිවිධාන, මනාව ක්‍රියාත්මක වන මුදල් වෙළඳපොළ, වඩාත් නිවැරදි මුදල් ප්‍රවාහ පුරෝකථනයන්, ඉලක්කගත මුදල් ශේෂයන් නඩත්තු කිරීමට නිසි මූල්‍ය උපකරණ භාවිතය සහ දක්ෂ මුදල් කළමනාකරුවන් බඳවා ගැනීම යන ක්‍රමෝපාය ද ජාත්‍යන්තර වශයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම කිරීම පිණිස යොදා ගනු ලබයි (Gamkrelidze, 2023).

## 2. මුදල් කළමනාකරණයේ අභියෝග

ප්‍රායෝගික නොවන අයවැය යෝජනා, ආදායම්වල ඉහළ අස්ථාවරත්වයක් පැවතීම, මුදල් ප්‍රවාහ සංචරණය පිළිබඳ විශ්වසනීය පුරෝකථන නොමැති වීම, ප්‍රමාණවත් තොරතුරු නොමැතිකම, පුහුණු මානව සම්පත් හිඟය, භාණ්ඩාගාරයට ප්‍රමාණවත් අධිකාරියක් නොමැති වීම, අඩු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, මූල්‍ය උපකරණවල භාවිතය මඳ බව සහ දුර්වල මුදල් වෙළඳපොළ, ගෙවීම් සහ පියවීම් අංශයේ ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් සහ මහ බැංකුව සමග ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැති වීම යන කරුණු රටක නිසි මූල්‍ය කළමනාකරණය කෙරෙහි අභියෝග එල්ල කරයි. මූල්‍ය අර්බුදයක් පවතින කාල වකවානුවල දී මෙම අභියෝගවල බලපෑම් ඉහළ යයි.

## 3. මූල්‍ය අර්බුදය නිසා මුදල් කළමනාකරණයට ඇතිවන බලපෑම්

මූල්‍ය අර්බුදයක් පවතින කාල වකවානුවේ දී රජයේ ආදායම් පහත වැටීම, අර්බුද හා සම්බන්ධ වියදම් ඉහළ යෑම නිසා මූල්‍ය අවශ්‍යතාව වැඩි වීම, රජයේ මුදල් ප්‍රවාහයේ අවිනිශ්චිතතාව ඉහළ යෑම සහ අස්ථාවරත්වය වැඩි වීම, සහ මූල්‍ය වෙළඳපොළවල්

සඳහා සීමා සහිත ප්‍රවේශය සහ ඉහළ අවදානම් ඇතිවීම මුදල් කළමනාකරණයට ඇතිවන ප්‍රධාන අභියෝග ලෙස දැක්විය හැකි ය. එමනිසා, හදිසි වියදම් වැඩිවීම, ආදායමේ පහත වැටීම සහ අර්බුදයට අදාළ හදිසි වියදම් පිළිබිඹු වන පරිදි රජයේ මුදල් සැලසුම් සකස් කිරීම මුදල් කළමනාකරුවන්ගේ වගකීම වේ. මෙම කාර්යය ඉටු කිරීමේ දී, මුහුණ දීමට සිදුවන අභියෝග කිහිපයක් පහත දක්වා ඇත.

- මූල්‍ය අර්බුදයේ බලපෑම තක්සේරු කිරීම සහ විවිධ හදිසි ප්‍රතිපත්ති සංශෝධන සඳහා රජයේ මුදල් මෙහෙයුම ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න;
- රජයේ දෛනික මුදල් ශේෂය සහ එහි මුදල් ප්‍රවාහ අවශ්‍යතා පුරෝකථනය කරන්නේ කෙසේද යන්න; සහ
- මූල්‍ය අර්බුදය නිසා වැඩිවන ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් මුදල් සොයා ගන්නේ කෙසේද යන්න;

2023 වසරේ දී ශ්‍රී ලංකාවේ තුළ පැවති ආර්ථික සහ දේශපාලනික අර්බුද හමුවේ වසර ආරම්භයේ දී සකස් කරන ලද මුල් ඇස්තමේන්තු, 2023 මුල් මාස හය තුළ දී ම සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත් වසර අග භාගය වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් රැස් කිරීම ඉහළ මට්ටමක පැවතීම නිසා භාණ්ඩාගාර ගිණුම් තුළ පැවති අතිරික්ත අරමුදල් ආයෝජනය කරන ලදී. තව ද, ඉන්දීය රේඛීය ණය යෝජනා ක්‍රමය සහ ලෝක බැංකු ණය ආධාර යටතේ ලැබුණු මුදල්වලින් භාණ්ඩාගාර හිඟය පියවා ගැනීමට කටයුතු කරන ලදී.

## 4. මුදල් කළමනාකරණයට ඇතිවන බලපෑම් ජය ගන්නේ කෙසේද?

මෙම අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා නවීන මුදල් කළමනාකරණය, ක්‍රමෝපායයන් හතරක් වටා කේන්ද්‍රගත විය යුතු ය. අරමුදල් ඒකාබද්ධ කිරීම (cash consolidation), මූල්‍ය පුරෝකථනය[1] (cash forecasting), මුදල් ශේෂ කළමනාකරණය (management of cash balances) සහ ආයතනික විධිවිධාන (institutional arrangements) ඒ අතර වේ (IMF, 2022).

### 4.1 අරමුදල් ඒකාබද්ධ කිරීම

උග්‍ර මූල්‍ය අර්බුදයක් හමුවේ අරමුදල් ඒකාබද්ධ කිරීම තුළින් භාණ්ඩාගාරයේ ඇති සියලු ම මුදල් ඒකරාශී කර ගැනීමට සහ එයින් උපරිම පහසුකම් සැලසීමට අවස්ථාව සැලසේ. රජයේ මුදල් ගිණුම්වල ශේෂයන් ඒකාබද්ධ කරමින් තනි භාණ්ඩාගාර ගිණුමක් (TSA) පවතින රජයන්ට මූල්‍ය අර්බුදය පවතින කාල වකවානුවේ දී ඔවුන්ගේ මුදල් ප්‍රවාහ සහ ශේෂයන් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම පහසු වනු ඇත. එවැනි ඒකාබද්ධ ගිණුමක් පවතින රටවලට ඒකාබද්ධ ගිණුමේ ආවරණය තවදුරටත් පුළුල් කිරීමට සහ මූල්‍ය පද්ධතිය හරහා මුදල් ගලා යෑමේ වේගය වැඩි දියුණු කිරීමට හැකියාව පවතී. කෙසේ වෙතත්, බොහෝ රටවල, භාණ්ඩාගාරයේ පාලනයෙන් බැහැර ව රජයේ අමාත්‍යාංශ, නියෝජිතායතන සහ අමතර ආයතන වල අයවැය සඳහා ගිණුම් රාශියක් පවත්වාගෙන යනු ලබයි.

### 4.2 මූල්‍ය පුරෝකථනය

රජයේ මුදල් ප්‍රවාහ කළමනාකරණය පිළිබඳ තීරණ සඳහා නිරවද්‍ය සහ කාලෝචිත මූල්‍ය පුරෝකථනයක් තිබීම ඉතා වැදගත් වේ. වර්තමානයේ දී රජයේ ආදායම් සහ වියදම්වල පවතින ඉහළ අස්ථාවරත්වය සහ හදිසි වියදම් සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව හේතු කොට ගෙන මූල්‍ය පුරෝකථනයන් ගේ විශ්වසනීයත්වය පවත්වා ගැනීම අභියෝගාත්මක වී ඇත. විශ්වසනීය උපකල්පන නොමැතිකම සහ වියදම් සහ ආදායම්වල අතීත රටාවන් අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ හොඳ පුරෝකථනයක් නොවීම යන කාරණා නිසා නිරවද්‍ය මූල්‍ය පුරෝකථන සකස් කිරීමට අවශ්‍ය ඉහළ සංඛ්‍යාත (දිනපතා හෝ සතිපතා) දත්ත රැස් කිරීම රජයේ උපාය මාර්ගය විය යුතු ය. එහි දී ආයතන අතර නිල සන්නිවේදනය කාර්යක්ෂම ව පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මූල්‍ය ප්‍රවාහ සමීප ව නිරීක්ෂණය කිරීම, පුරෝකථනය දෝෂ සඳහා හේතු විමර්ශනය කිරීම සහ එහි ප්‍රතිඵලය පසු විශ්ලේෂණයන් සඳහා යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ.

### 4.3 මුදල් ශේෂ කළමනාකරණය

රජයේ මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය මුදල් ශේෂයන් සහ සියලු ම රජයේ මුදල් ගිණුම්වල ශේෂ ඒකාබද්ධ කරමින් සාදන ලද තනි භාණ්ඩාගාර ගිණුමක (TSA) පවත්වා ගත යුතු ය. මහ බැංකුව සමඟ

---

1. යම් කාල සීමාවක් තුළ පවත්නා මුදල් තැන්පතු, අපේක්ෂිත මුදල් ලැබීම් සහ අවශ්‍ය ගෙවීම් ඇස්තමේන්තු කිරීම මගින් ප්‍රමාණවත් මෙහෙයුම් ද්‍රවශීලතාව සහතික කිරීම සඳහා රජයයන් විසින් මුදල් පුරෝකථනය සිදු කරනු ලබයි.

මුදල් අයිරා පහසුකම් සහ අනෙකුත් බැංකු සමග ණය මාර්ග (credit lines) පවත්වා ගැනීම ට ඇති හැකියාව සොයා බැලීම තුළින් මුදල් කළමනාකරුවන් මත පවතින පීඩනය තාවකාලික ව අඩු කර ගත හැක. නමුත් එවැනි ක්‍රියාමාර්ග ඉතා කෙටි කාලීන මුදල් හිඟය පියවීමේ ක්‍රමෝපායන් ලෙස භාවිත කිරීමට විනා රාජ්‍ය මූල්‍ය හිඟය පියවා ගැනීමේ (Government Deficit Financing) තවත් ප්‍රභවයක් ලෙස යෝග්‍ය නොවේ.

තරමක මූල්‍ය අතිරික්තයක් පොදු ගිණුම තුළ පවත්වාගෙන යෑම (cash buffer) යනු මුදල් ප්‍රවාහ අස්ථාවරත්වයට එරෙහි ව රජයට ක්‍රියාත්මක කළ හැකි ආරක්ෂක පියවරකි (safety net). ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු ව බොහෝ රටවල් විසින් මෙම මුදල් අතිරික්තය පිහිටුවීම හෝ වැඩි කිරීම සිදු කරන ලදී. මුදල් ප්‍රවාහවල අස්ථාවරත්වය වැඩි වීම සහ වෙළෙඳපොළ අවපාත වල දී පවත්වාගෙන යා යුතු මුදල් අතිරික්ත මට්ටම සමාලෝචනය කිරීම අවශ්‍ය විය හැකිය. මුදල් අතිරික්තතා මට්ටම නිවැරදි ව නිර්ණය කිරීම සඳහා මුදල් කළමනාකරුවන් විසින් පවත්නා මූල්‍ය අර්බුදයේ බලපෑම පිළිබඳ නිවැරදි අධ්‍යයනයක් කළ යුතුය.


### 4.4 ආයතනික විධිවිධාන

අවශ්‍ය මුදල් කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආයතනික විධිවිධාන ශක්තිමත් කළ යුතු ය. මෙම විධිවිධාන, රාජ්‍ය මූල්‍ය අර්බුදය කළමනාකරණය කිරීම සඳහා වන රජයේ සමස්ත සැලැස්ම හා සම්බන්ධ කළ යුතු වේ.

මූල්‍ය අර්බුදයක් පවතින කාල පරිච්ඡේදවල දී, මුදල් අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් ප්‍රධාන අමාත්‍යාංශය /දෙපාර්තමේන්තු, වියදම් සහ ආදායම් එකතු කිරීමේ ආයතන සහ මහ බැංකුව අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

තවද, පවතින ණය සඳහා මූල්‍යකරණය සහ ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීමට මුදල් සහ ණය කළමනාකරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කළ යුතු ය. සමහර රටවල්වල මුදල් සහ ණය කළමනාකරණය සඳහා කාර්යක්ෂම තීරණ ගැනීමට ඒකාබද්ධ රාමුවක් ස්ථාපනය කර තිබේ. මේ අතර, ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ ණය නිකුත් කිරීමේ සහ ණය ගැනීමේ සැලසුම් යාවත්කාලීන කිරීමේ දී මූල්‍ය ප්‍රවාහ පුරෝකථනය අධ්‍යනය කළ යුතු වේ. මූල්‍ය පුරෝකථන සඳහා ආයතනික වගකීම් සහ විධිවිධාන පහත රූපසටහන 1 මගින් පෙනුම් කරයි.

**රූපසටහන 1 : පුරෝකථනය සඳහා ආයතනික වගකීම් සහ විධිවිධාන**



a- අයවැය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සිදු කරන නිලධාරීන්

b- ණය සහ අනෙකුත් මූල්‍යකරණ මෙහෙයුම් සිදු කරන නිලධාරීන්

c- පුරෝකථන සම්බන්ධීකාරක වෙත ආදායම් වියදම් සහ ණය දත්ත සැපයීම

d- පුරෝකථන සම්බන්ධීකාරක වෙත වෙළෙඳපොළ දත්ත සැපයීම

මූලය : (Williams, 2009)

## 5. නිගමනයන්

ගෝලීය මූල්‍ය අර්බුදය සහ මෑත කාලීන COVID-19 වසංගතය නිසා අනපේක්ෂිත ආදායම් පහත වැටීම් සහ වියදම් වැඩිවීම්වලට නිසි ප්‍රතිචාර දක්වමින් රජයේ මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ඉස්මතු කරන ලදී. මූල්‍ය අර්බුදයක් තුළ අවිනිශ්චිත ආර්ථික සහ වෙළෙඳපොළ තත්ත්වයන්, දුර්වල අයවැය පාලනයන් සහ දුර්වල මුදල් ප්‍රවාහ පුරෝකථනයන් ඇති රටවල මූල්‍ය තත්වය තවදුරටත් නරක අතට හැරෙයි. එහෙත්, නවීන මුදල් කළමනාකරණ ක්‍රමෝපායයන් මගින් ප්‍රමාද වූ ගෙවීම් සහ සමුච්චිත හිඟ මුදල්වලින් සිදුවන බලපෑම වළක්වා ගැනීමට හැකි වෙයි (Cangoz & Secunho, 2021).

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාව විසින් මුහුණ දුන් ආර්ථික සහ මූල්‍ය අවපාතවල අත්දැකීම් පාදක කොට මුදල් ප්‍රවාහ පුරෝකථනවල නිරවද්‍යතාව වැඩි කර ගැනීම, තාවකාලික මුදල් හිඟය සඳහා මූල්‍ය වෙළෙඳපොල උපකරණ යෝග්‍ය පරිදි භාවිත කිරීම සහ අතිරික්ත මුදල් TSA ගිණුම තුළ නිෂ්ක්‍රීය ව පවත්වා ගැනීම නිසා වන පිරිවැය අඩු කිරීමට එම ශේෂ ආයෝජනය කිරීම ඇතුළු ව මුදල් කළමනාකරණයේ සියලුම අංශවල කෙටිකාලීන වැඩිදියුණු කිරීම් මගින් මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගත හැකි ය. මේ සඳහා, මූල්‍ය කළමනාකරණයේ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීම, පාලන ව්‍යුහය වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය මූල්‍ය, ණය සහ මුදල් ප්‍රතිපත්ති සමඟ සම්බන්ධීකරණය කිරීම ද අත්‍යවශ්‍ය වේ.

References:

Cangoz, M., & Secunho, L. (2021, June 21). Cash management: how do countries perform sound practices. Revista Nacional de Administración.

Gamkrelidze, D. (2023, 08 31). Cash Management during a Crisis. Delhi, India: SARTATAC.

IMF. (2022). Government Cash Management Under Fiscal Stress. Washington, DC: IMF- Fiscal Affairs .

Williams, M. (2009). Government Cash Management: International Practice. Oxford : Oxford Policy Management.

ඔබට
මිලියනයක දිනුමක්!
දිනුම ලබා ගැනීමට
සුළු අමතර ගාස්තුවක් ගෙවන්න

ඔයාට මගේ ආදරය
දැනෙනවා නම්...
මේ, මට ඔයාගේ
උදව් ඕනම වෙලාවයි

ඔබේ නමට
පාර්සලයක් ඇත!
රේගුවෙන් නිදහස් කිරීමට
සහනදායී ගාස්තුවක් ගෙවන්න

ඔබ වටිනා වාහනයක් දිනා ඇත!
නිවසටම ගෙන්වා දීමට අදාළ
රේගු ගාස්තු ගෙවන්න

# අනගි රැකියාවක් !
සුළු ලියාපදිංචි ගාස්තුවක් පමණයි

# සැලකිලිමත් වන්න

## වංචාකරුවන්ගේ මෙ වැනි ක්‍රමෝපායන්ට නො රැවටෙන්න

ඔබගේ වයස් සීමාව, ස්ත්‍රී/පුරුෂ භාවය, අධ්‍යාපන පසුබිම හෝ ආදායම් මට්ටම
කුමක් වුවත් පහසුවෙන් ම ඔබත් මෙම වංචාකරුවන්ගේ ගොදුරක් විය හැක.

වංචාවන්ට ගොදුරු වූ විට ඔබට සිදු වන මූල්‍යමය අලාභය සහ ඇති වන මානසික පීඩාව
සුළුපටු නො වේ.

ඔබ රැවටීම සඳහා ලිපි, තැපැල් පත්, සමාජ ජාල අඩවි, දුරකථන ඇමතුම්, කෙටි පණිවුඩ, විද්‍යුත්
තැපෑල, අන්තර්ජාල පණිවුඩ හුවමාරු සේවා මගින් වංචාකරුවන් ඔබ හා සම්බන්ධ විය හැක.

වංචාකරුවන්ගේ අරමුණ ඔබ රවටා ඔබගේ විශ්වාසය දිනා ගැනීමයි.
ඔවුනට නො රැවටීම ඔබේ වගකීමයි.


මූල්‍ය බුද්ධි ඒකකය
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.

112477125
112477692
info@fiusrilanka.gov.lk




# දැන්වීමයි

## මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ වෙනස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලු ම මුදල් නෝට්ටු සහ කාසි ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම අගයක ගෙවීමක් සිදු කිරීම සඳහා වලංගු මුදල් වේ.

කෙසේ වෙතත්, විසිතුරු භාණ්ඩ සහ තෑගි අයිතම සකස් කිරීම සදහා වලංගු මුදල් නෝට්ටු යොදා ගැනීම සහ එවැනි ක්‍රියාකාරකම් සමාජ මාධ්‍යය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවණතාවක් කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී තිබේ.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 55 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව, පහත දක්වා ඇති කටයුතු සිදු කරගෙන යෑමෙහි නියැලී සිටින ඕනෑ ම පුද්ගලයෙකු වරදක් සිදු කරයි.

(අ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කපා දැමීම, සිදුරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් විකෘති කරනු ලැබීම.

(ආ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත යමක් මුද්‍රණය කිරීම, මුද්‍රාවක් තැබීම හෝ යමක් ඇඳීම හෝ යම් මුදල් නෝට්ටුවක් මත හෝ යම් මුදල් නෝට්ටුවකට යම් මුද්‍රාවක් හෝ ලකුණක් අලවනු ලැබීම.

(ඇ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවකට හෝ ඒ මත වෙළෙඳ දැන්වීමක ස්වභාවයෙන් හෝ ආකෘතියෙන් යුත් යම් දෙයක් ඇමිණීම හෝ අලවනු ලැබීම.

(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කවර හෝ ආකාරයකින් ප්‍රතිනිර්මාණය කරන හෝ යම් මුදල් නෝට්ටුවක අනුරුවක් සෑදීම; හෝ

(ඉ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් වලංගු මුදලක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් භාවිත කිරීම.

ඉහත දැක්වූ ආකාරයේ වරදකට හසුවන යම් පුද්ගලයෙකු මෙම පනතේ 111 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට සමාලෝචන නඩුවකින් අනතුරු ව වරදකරු වීම මත, රුපියල් මිලියන විසි පහකට නොවැඩි දඩ මුදලක් හෝ තෙවසරකට නොඅඩු කාලයක් සඳහා සිරදඬුවකමකට හෝ එවැනි දඩයකට සහ සිර දඬුවමකට යන දෙකට ම යටත් විය යුතු ය.

ඉහත සඳහන් ආකාරයේ නීති විරෝධී කටයුතුවල නියැලීමෙන් වැළකී සිටින ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත දැඩි ව අවධාරණය කර සිටියි.

**ව්‍යවහාර මුදල් අධිකාරී - ශ්‍රී ලංකා මහ බැංකුව**